# සිංහල

# 1

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2012
දෙවන මුද්‍රණය - 2013
තෙවන මුද්‍රණය - 2014
සිවුවන මුද්‍රණය - 2015
පස්වන මුද්‍රණය - 2016
සයවන මුද්‍රණය - 2017
හත්වන මුද්‍රණය - 2018
අටවන මුද්‍රණය - 2019
නවවන මුද්‍රණය - 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0431-0

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්**
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජිවත් වන අප මෙම නිවසේ
සොළින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නගා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යාස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යාස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ නව නවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශිර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

**නියාමනය හා අධීක්ෂණය :-**

| | | |
|---|---|---|
| ජී. එන්. අයිලප්පෙරුම | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |

**මෙහෙයවීම :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි | - | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි | - | අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**සම්බන්ධීකරණය :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය රංවල පඤ්ඤවාස හිමි | - | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>(පිරිවෙන් සම්බන්ධීකරණ),<br>අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ඩී. එම්. ජේ. පුෂ්පකුමාර | - | නියෝජ්‍ය කොමසාරිස් (පාලන)<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**උපදේශක මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| පූජ්‍ය බලංගොඩ සෝභිත හිමි | - | පරිවේණාධිපති,<br>විද්‍යෝදය මහ පිරිවෙන, කොළඹ 10. |
| මහාචාර්ය විමල් ජී. බලගල්ලේ | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය රත්න විජේතුංග | - | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. |
| මහාචාර්ය ඊ. ඒ. වික්‍රමසිංහ | - | ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි<br>විශ්වවිද්‍යාලය, හෝමාගම. |
| මහාචාර්ය ආනන්ද අබේසිරිවර්ධන | - | සිංහල අධ්‍යයන අංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |

**ලේඛක මණ්ඩලය :-**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. ඩී. පද්මිණී නාලිකා (සභාපති) | - | කොමසාරිස් (නිෂ්පාදන හා බෙදාහැරීම්), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |
| එම්. ජේ. එම්. දමයන්ති | - | නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| එල්. ජේ. සුනිල් ප්‍රේමරත්න | - | සමස්ත ලංකා සිංහල විෂය උපදේශක (පිරිවෙන්). |
| ජේ. එම්. වීරසාර ජයසිංහ | - | ගුරු උපදේශක (පිරිවෙන්). |

**සංස්කරණය :-**

| | | |
|---|---|---|
| අයි. බී. විමලවංශසූරිය | - | අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන් - විශ්‍රාමික), අධ්‍යාපන අමාත්‍යාංශය. |

**සෝදුපත් කියවීම :-**

| | | |
|---|---|---|
| වයි. පී. එන්. පී. විමලසිරි | - | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර. |

**පිට කවරය :-**

| | | |
|---|---|---|
| ඩබ්ලිව්. අයි. හංසිකා හීරසේකර | - | පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

**පරිගණක තාක්ෂණය :-**

| | | |
|---|---|---|
| එම්. ජේ. එම්. දමයන්ති | - | නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| ජේ. එච්. මනෝරිකා ප්‍රියංගනි | - | පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. |

# පටුන



| | |
|---|---|
| 01. සිංහල හෝඩිය | 01 - 12 |
| 02. නාම පද | 13 - 21 |
| 03. ක්‍රියා පද | 22 - 28 |
| 04. වාක්‍ය නිර්මාණය | 29 - 33 |
| 05. විවිධාර්ථවත් පද | 34 - 38 |
| 06. වාක්‍ය රචනය | 39 - 46 |
| 07. විරාම ලක්ෂණ | 47 - 50 |
| 08. ප්‍රායෝගික ලේඛන | 51 - 55 |
| 09. අර්ථාවබෝධය | 56 - 60 |

1

# සිංහල හෝඩිය

මවුබස මිනිසාට උරුම වන ජන්ම දායාදයකි. අපට උරුම මවුබස සිංහල යි. ඒ මවුබසින් කතාබහ කරන අප එම ශබ්ද නැතහොත් වචන ලියා දැක්වීමට යොදා ගන්නා සංකේත, අකුරු හෙවත් අක්ෂර ලෙස සරල ව හැඳින්විය හැකි යි. සිංහල භාෂාව ලියා දැක්වීමට අප සතු ව ඉතා විධිමත් අක්ෂර මාලාවක් තිබේ.

ඔබ කියවන මේ සිංහල අකුරු මෙලෙස අද පවතින රවුම් මටසිලිටු හැඩය දක්වා වර්ධනය වීමට වසර දහස් ගණනක් පුරා සිදු වූ වෙනස්කම් හේතු වී තිබේ. මීට වසර දෙදහසකට පමණ පෙර සිංහල අකුරු වැඩිපුර ම ළං වූයේ ඉරි හැඩතලවලට මිස රවුම් හැඩතලවලට නොවේ. දීර්ඝ කාලයක් තිස්සේ සැඩ පහරට හසු ව ගල්පරවල හැපෙමින්, පෙරළෙමින් ගංගා පතුළ දිගේ පහළට ඇදී එන තිරිවානා ගල් කැට රවුම් හැඩයකට පත් වී ඇත්තා සේ සිංහල අකුරුවල වටකුරු හැඩයට ද දිගු ඉතිහාසයක් තිබේ. සිංහල 'ක' සහ 'ල' අකුරු දෙක, ඉරි කෑලි ස්වරූපයේ සිට වර්තමාන රවුම් හැඩයට පත් වී ඇති ආකාරය දෙස බැලූ විට ඔබට මේ එක අක්ෂරයක පවා කෙතරම් වෙනසක් සිදු වී ඇද්දැයි සිතා ගැනීම අපහසු නොවනු ඇත.



අන් අකුරු ද මෙසේ ම ය. ඉදිරියේ දී ඔබට ඉතිරි අක්ෂර පිළිබඳ ව ද මනා වැටහීමක් ලබා ගත හැකි වනු ඇත.

වසර දහස් ගණනක් තිස්සේ අපේ අතීත මී මුත්තන් විසින් ඉතා වෙහෙස මහන්සි වී ගලෙහි කොටා මේ සිංහල අකුරු රැක දී තිබේ. ඔවුන් කෙරෙහි කෘතඥතා පෙරදැරි ව ඒවා මැනවින් උගෙන ඉදිරි පරපුරට ද තිළිණ කිරීමට අපි අදිටන් කර ගනිමු.

දිගු ඉතිහාසය නිසා ම ලොව වෙනත් සමහර පැරණි භාෂාවල මෙන් සිංහල භාෂාවේ ද ඇති වූ තවත් සුවිශේෂ ලක්ෂණයක් තිබේ. ඒ, කථිත (කථන) හා ලිඛිත වශයෙන් භාෂා ස්වරූප දෙකක් සිංහල භාෂාවේ පැවතීම යි. අප කතාබහ කරන, කථා ව්‍යවහාරය භාෂාවේ කථිත ස්වරූපය යි. ලිවීමට යොදා ගනු ලබන ලේඛන ව්‍යවහාරය භාෂාවේ ලිඛිත ස්වරූපය යි.

'මං ඉස්කෝලේ යනවා.' - *කථන ව්‍යවහාරය*

'මම පාසල් යමි.' - *ලිඛිත ව්‍යවහාරය*


ඉහත උදාහරණ දෙක දෙස විමසිලිමත් ව අවධානය යොමු කිරීමෙන් සිංහල භාෂාවේ තිබෙන මේ දෙයාකාර වූ වෙනස හොඳින් පැහැදිලි කර ගත හැකි යි. මේ වෙනස් ස්වරූප හෙවත් රූප දෙක "ද්විරූපතාව" නමින් හඳුන්වයි.

කථිත භාෂා ස්වරූපය සරල යි; ලේසි යි; ඉගෙනීම මගින් භාවිතය පහසු යි.

ලිඛිත භාෂා ස්වරූපය තරමක් සංකීර්ණ යි; විධිමත් අධ්‍යාපනයක් මගින් උගත යුතු යි.

සාහිත්‍ය පොත්පත් රැසක් ලියවී තිබෙන්නේ ලිඛිත භාෂා ස්වරූපයෙනි. ලිඛිත භාෂාව හොඳින් භාවිත කිරීමට දැන ගැනීම අත්‍යවශ්‍ය වූවකි.

පරපුරෙන් පරපුරට දැනුම පවරා දීමට මූලික ම වාහකය නැතිනම් වාහනය වන්නේ භාෂාව යි. එබැවින් මේ භාෂා ස්වරූප දෙක ම භාෂාවේ පෝෂණයට ඉතා වැදගත් වෙයි. සරල වාහනයක උදාහරණයකින් ම මේ ද්විරූපතා භාෂා ලක්ෂණය සරල ව පැහැදිලි කර ගත හැකි ය.




බස් පාපැදිය

*1. රූප සටහන*

පාපැදියක් සමබර ව පැද යෑමට නම් රෝද දෙකෙහි අවශ්‍ය පමණට හුළං පිරී, ටයර් හා අනෙකුත් උපාංග යහපත් අයුරින් පැවතිය යුතු ය. අපේ භාෂාව ද ඉදිරියට රැක ගැනීමට නම් බස් පාපැදියේ රෝද දෙක සමබර ව පවත්වාගෙන යමින් වෙර යොදා එය පැද යා යුතු ය.

**ඔබේ බස් පාපැදියේ රෝද යුගල කථිත හා ලිඛිත භාෂා දැනුම නමැති සුළඟින් හොඳින් පුරවා ගන්න. කැපවීමෙන් ලබා ගත් ඒ දැනුම ඉදිරි පරපුරට ගෙන යන වාහකයා ඔබ බව මැනවින් සිතේ දරා ගන්න. බස් පාපැදියේ සීනුව නද දෙන්නා සේ සිංහල හෝඩිය හා වචන ශබ්ද නගා නිවැරදි ව උච්චාරණය කරන්න.**

ඔබ පැද යා යුතු බස් පාපැදියේ ප්‍රධාන සැකිල්ල බඳු සිංහල භාෂාවේ අක්ෂර මාලාව දෙස දැන් අවධානය යොමු කළ යුතු යි.

සිංහල හෝඩියේ හෙවත් අක්ෂර මාලාවේ අකුරු සංඛ්‍යාව පිළිබඳ විවිධ අදහස් පවතී. මිශ්‍ර සිංහල හෝඩියේ අකුරු 54කි. එහෙත් වර්තමාන සිංහල හෝඩියේ භාවිත වන අක්ෂර සංඛ්‍යාව 60ක් ලෙස දැක්විය හැකි ය. මෙහි දක්වා ඇත්තේ එම නූතන අක්ෂර මාලාව යි.

මෙම අක්ෂර මාලාවේ මුලින් ම සඳහන් වන වෙනත් අකුරක උපකාරයක් නොමැති ව තනි ව ශබ්ද කළ හැකි අකුරු 18ක් තිබේ. ඒවා ස්වර නම් වේ. පහත සටහනේ රෝස පැහැයෙන් මුලින් ම දක්වා ඇත්තේ ඒ තනි ව ම ශබ්ද නැඟිය හැකි තරම් ප්‍රාණයක් තිබෙන ප්‍රාණාක්ෂර හෙවත් ස්වර අක්ෂර (පොරකුරු) ය. ඉතිරි සියලු අකුරු ව්‍යඤ්ජන අක්ෂර යි. 'ක්. . . ෆ්. . .' යනාදි ආකාරයට හල් අකුරු වශයෙන් පවතින එම අකුරු උච්චාරණය කිරීමට ස්වර අකුරු එකතු කර ගැනීම අවශ්‍ය වේ. එමගින් මේ ව්‍යඤ්ජන අක්ෂර උච්චාරණය පහසු වෙයි.

# නූතන සිංහල හෝඩිය

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| (අ)ං | (අ)ඃ | | | | |
| ක් | ඛ් | ග් | ඝ් | ඞ් | ඟ් |
| ච් | ඡ් | ජ් | ඣ් | ඤ් | ඦ් |
| ට් | ඨ් | ඩ් | ඪ් | ණ් | ඬ් |
| ත් | ථ් | ද් | ධ් | න් | ඳ් |
| ප් | ඵ් | බ් | භ් | ම් | ඹ් |
| ය් | ර් | ල් | ව් | | |
| ශ් | ෂ් | ස් | හ් | ළ් | ෆ් |

ලියා දැක්වීමේ පහසුව සඳහා බොහෝ අවස්ථාවල හෝඩිය තුළ මේ ව්‍යඤ්ජන හෙවත් ගාත්‍රාක්ෂරවල හල් ස්වරූපය ඉවත් කොට ලියා තිබෙනු දැකිය හැකි ය. එහෙත් ඉහත දක්වා ඇත්තේ, තනි ව උච්චාරණය කිරීම අපහසු ව්‍යඤ්ජනවල සැබෑ ස්වරූපය යි.

භාවිතයේ හා පාඩම් කර ගැනීමේ පහසුව සඳහා මේ ව්‍යඤ්ජනාක්ෂරවලට 'අ' ස්වරය එකතු කර හෙවත් ආරූඪ කර පහත දැක්වෙන පරිදි උච්චාරණය කිරීමට ඔබට පිළිවන. 'අ' ස්වරය එක් වූ විට ව්‍යඤ්ජන අක්ෂරයෙහි තිබූ හල් ලකුණ ( ් / ් ) ඉවත් වන්නේ ය.

උදා :- ක් + අ > ක
ම් + අ > ම

මෙම අක්ෂර මාලාවේ සඳහන් සමහර අකුරු අද භාවිතයේ දක්නට නැත. ඏ, ඐ (ඉලු, ඉලූ ශබ්ද) යනු අද භාවිත නොවන අකුරු දෙක යි. එහෙත් මෙම අකුරු සහිත ව ලියූ වචන සිංහල භාෂාවේ (වදන් කව් පොත වැනි සිංහල පොත්වල) යෙදී තිබෙන බැවින් මෙම අකුරු යුගලය හෝඩියෙන් ඉවත් කළ හොත් පොත්පත් කියවීමට හා නැවත පළ කරවීමට නොහැකි වනු ඇත. එබැවින් අද ව්‍යවහාර නොකළත් ඒ අකුරු සාම්ප්‍රදායික ව හෝඩියේ දක්වා ඇත.

ඉහත අක්ෂර මාලාවේ කහ පැහැති පසුබිමේ දක්වා ඇත්තේ වැඩි ශක්තියක් නැතිනම් මහා ප්‍රාණයක් දනවමින් කියවිය යුතු අකුරු 10කි. ඒවා මහාප්‍රාණ අක්ෂර නම් වේ.

ඛ්, ඝ්, ඡ්, ඣ්, ඨ්, ඪ්, ථ්, ධ්, ඵ්, භ්

හල් ස්වරූපයෙන් ඇති මේ මහප්‍රාණ අක්ෂර 'අ' ස්වරය එකතු කර උච්චාරණය පහසු කර ගත හැකි ය. ඒ මෙපරිදි ය.

| | | | |
|---|---|---|---|
| ඛ් + අ > ඛ | ඝ් + අ > ඝ | ඡ් + අ > ඡ | ඣ් + අ > ඣ |
| ඨ් + අ > ඨ | ඪ් + අ > ඪ | ථ් + අ > ථ | ධ් + අ > ධ |
| ඵ් + අ > ඵ | භ් + අ > භ | | |

මෙම හෝඩියේ සඳහන් ඟ් ඦ් ඬ් ඳ් ඹ් යන සඤ්ඤක අකුරු (අර්ධානුනාසික) පහ සහ ෆ් අක්ෂරය පෙර පැවති මිශ්‍ර සිංහල හෝඩියේ දක්නට නොවී ය. එහි පැවතියේ අක්ෂර 54කි. එම මිශ්‍ර සිංහල හෝඩියට ඉහත අකුරු හය ඇතුළත් කර එසේ ම එම මිශ්‍ර සිංහල හෝඩියේ අවසාන අකුරු දෙක වූ (අ)ං (අ)ඃ අක්ෂර දෙක ස්වර අක්ෂරවලට පසු ව සහ ව්‍යඤ්ජන අක්ෂරවලට මුලින් තබමින් මේ නූතන සිංහල හෝඩිය හෙවත් වර්ණ මාලාව සකස් කර තිබේ. එය අක්ෂර 60කින් යුක්ත ය.

> ව්‍යඤ්ජන අක්ෂරයකට ස්වරයක් එක් වූ විට කිසි දු පිල්ලමක් එකතු නොවී, තිබෙන පිල්ලම ද ඉවත් වන එක ම අවස්ථාව මේ 'අ' ස්වරය එකතු වන අවස්ථාව පමණි. එය හොඳින් මතක තබා ගන්න.

ඉහතින් දැක්වූ පරිදි ව්‍යඤ්ජන අක්ෂර තනි ව ශබ්ද කිරීම අපහසු නිසා ඒවාට ස්වර අකුරු එකතු කර හෙවත් ආරූඪ කර උච්චාරණය කෙරේ. එම එකතු කරන ස්වර වෙනුවට භාවිත කරන සංකේත, පිල්ලම් ලෙස හැඳින්වේ. පිල්ලමක් භාවිත නොවන එක ම ස්වරය අ බව මීට ඉහත දැක්වූයෙහි ය. වර්තමානයේ සුලබ ව භාවිත වන පිල්ලම් හැඳින ගනිමු.

එසේ ම ව්‍යඤ්ජන අක්ෂරවලට ස්වරාරූඪ වූ විට ස්වර නියෝජනය කරමින් එකතු වන පිල්ලම, අකුරුවල ස්වභාවය අනුව යම් වෙනසක්ම දක්වන බව භාෂා භාවිතයේ දී අවබෝධ වේ. උදාහරණ මගින් එය තවදුරටත් තහවුරු කර ගත හැකි ය.

| පිලි | පිල්ලමෙහි නම | එකතු වන ස්වර අකුර | ස්වරාරූඪ ව්‍යඤ්ජනාක්ෂර |
|---|---|---|---|
| ා | ඇලපිල්ල | ආ | කා, මා |
| ැ | ඇදපිල්ල/ ඇදය | ඇ | කැ, මැ, රැ |
| ෑ | දිගු ඇදපිල්ල/ දිගු ඇදය | ඈ | කෑ, මෑ, රෑ |
| ි | ඉස්පිල්ල | ඉ | කි, මි |
| ී | දිගු ඉස්පිල්ල | ඊ | කී, මී |
| ු / ු | පාපිල්ල | උ | කු, මු, රු, ළු |
| ූ / ූ | දිගු පාපිල්ල | ඌ | කූ, මූ, රූ, ළූ |
| ෘ | ගැටය සහිත ඇලපිල්ල | ඍ | කෘ, මෘ |
| ෲ | ගැටය සහිත ඇලපිලි දෙක | ඎ | කෲ, මෲ |
| ෙ | කොම්බුව | එ | කෙ, මෙ |
| ේ / ේ | කොම්බුව හා දීර්ඝත්ව ලකුණ | ඒ | කේ, මේ |
| ෛ | කොම්බු දෙක | ඓ | කෛ, මෛ |
| ො | කොම්බුව හා ඇලපිල්ල | ඔ | කො, මො |
| ෝ | කොම්බුව හා දීර්ඝත්ව ලකුණ සහිත ඇලපිල්ල | ඕ | කෝ, මෝ |
| ෞ | කොම්බුව හා ගයනුකිත්ත | ඖ | කෞ, මෞ |

් / ් හල් ලකුණ ව්‍යඤ්ජනාක්ෂරවල ස්වභාවය නිසාත් හල් ලකුණෙන් ස්වරයක් සංකේත නොවන නිසාත් එය පිල්ලමක් ලෙස නොසැලකේ.

# අකාරාදි පිළිවෙළ

අ, ආ, ඇ, ඈ, . . . ක්, ෂ්, යනාදි වශයෙන් හෝඩියේ අකුරු යෙදෙන පිළිවෙළට වචන ගැළපීම අකාරාදි පිළිවෙළ යි. ශබ්ද කෝෂ, විශ්ව කෝෂ, ඡන්ද ලැයිස්තු ආදිය සකස් කිරීම වැනි පිළිවෙළකට විධිමත් ව කළ යුතු කාර්යයක දී මේ අකාරාදි පිළිවෙළ අතිශයින් වැදගත් වෙයි.

අකාරාදි පිළිවෙළට වචන ගැළපීමට නම් හෝඩියේ වචන යෙදෙන අනුපිළිවෙළ ගැන මනා දැනුමක් තිබිය යුතු ම බව ඔබට මේ වන විට වැටහී ඇතුවා නිසැක ය.

නිදසුනක් මඟින් මේ පිළිවෙළ ද පැහැදිලි කර ගනිමු. පවුලක සමාජිකයන් වයසේ පිළිවෙළ අනුව පෙළගැස්විය හැකි එක් අවස්ථාවක් සහ එම පිරිස ම අකාරාදි පිළිවෙළට යෙදෙන අන්දම පිරික්සන්න.

| වයසේ අනුපිළිවෙළට | අකාරාදි පිළිවෙළට |
|---|---|
| සීයා | අක්කා |
| ආච්චි | අම්මා |
| තාත්තා | අයියා |
| අම්මා | ආච්චි |
| අක්කා | තාත්තා |
| අයියා | නංගි |
| නංගි | මල්ලි |
| මල්ලි | සීයා |

ඉහත විවිධ වර්ණවලින් ලියා ඇති අම්මා, තාත්තා වැනි වචන කිහිපය සෑදී ඇති අයුරු බලන්න. ඒ වචනවල තනි ව ම යෙදී ඇති ස්වර අකුරු සහ ස්වර අකුරුවල උපකාරය ඇති ව පිල්ලම් සහිත ව යෙදී ඇති අකුරු පිළිබඳ ව දැන් අපි විමසා බලමු.

| | | |
|---|---|---|
| අක්කා | = අ + ක් + ක් + ආ | = අක්කා |
| අම්මා | = අ + ම් + ම් + ආ | = අම්මා |
| අයියා | = අ + ය් + ඉ+ ය් + ආ | = අයියා |
| ආච්චි | = ආ + ච් + ච් + ඉ | = ආච්චි |
| තාත්තා | = ත් + ආ + ත් +ත් + ආ | = තාත්තා |
| නංගි | = න් + අ + ං + ග් + ඉ | = නංගි |
| මල්ලි | = ම් + අ + ල් + ල් + ඉ | = මල්ලි |
| සීයා | = ස් + ඊ + ය් + ආ | = සීයා |

ඉහත පවුලේ සාමාජිකයන්ගෙන් සැදුණු උදාහරණය දෙස බැලීමේ දී ඔබට මින් පෙර උගත් පරිදි ස්වර හා ව්‍යඤ්ජන අකුරු වෙන වෙන ම යෙදීමත් ඒවා එකතු වී හෙවත් ස්වරාරූඪ වී වචනවල යෙදෙන විලාසය පිළිබඳ වත් පැහැදිලි අවබෝධයක් ලැබෙනු ඇත. එසේ ම එම එකතු වන ස්වර, සංකේතවත් කරන පිලි පිළිබඳ ව ද වැටහීමක් එමගින් ලැබෙනු ඇත. එමෙන් ම අකාරාදි පිළිවෙළ ගැන ද මේ සමග ම විමසා බැලීමට පිළිවන.

අකාරාදි පිළිවෙළ සැලකීමේ දී වචන කිහිපයක මුලින් ම යෙදෙන අකුර එක ම නම් එහි ඇල පිලි, පා පිලි ආදිය නියෝජනය කරන ස්වර අකුරේ අනුපිළිවෙළ විමසිය හැකි ය. ඒවාත් සමාන වූ විට දෙවෙනි අකුර, පිළිබඳ ව විමසා බලමු. විට එක් ව ඇති ස්වර ආදිය හෝඩියේ යෙදී ඇති පිළිවෙළට වචන පෙළගැස්විය හැකි ය.

# කුසලතා වර්ධනයට:

1. හෝඩිය කටපාඩම් කර අනුපිළිවෙළට මතකයෙන් ලියා දක්වන්න.

2. ක ච ට ත ප සහ ග ජ ඩ ද බ යන අකුරුවල මහාප්‍රාණ අක්ෂර පිළිවෙළින් ලියන්න.

3. එසේ ම 'කචටතප' හා 'ගජඩදබ' වචන මතක තබා ගෙන ඒ අනුසාරයෙන් ව්‍යඤ්ජනාක්ෂර යෙදෙන පිළිවෙළ ලිවීමට පුහුණු වන්න.

4. පහත රූප සටහන අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



2. රූප සටහන

(අ) උචිත අකුරු තෝරා පහත බඳුන් පුරවන්න. එක් අකුරක් එක බඳුනකට පමණක් දමන්න.




(ආ) 2 රූපසටහනේ රාමුව කොටසේ ඉහළින් සඳහන් පිල්ලම් සහ හල් ලකුණු භාවිත කර එළවළු වර්ග 10ක නම් ලියන්න.

(ඇ) ඒ ක්‍රමයට ම මැල්ලුමට ගන්නා පලා වර්ග හයක නම් ලියන්න.

(ඈ) මොනර රාමුවේ පහත තීරුවේ ඇති අක්ෂර පහට කියන නම් තුනක් සඳහන් කොට එම අකුරු යෙදී ඇති වචන 15ක් ලියා දක්වන්න. ('ළ්' යෙදෙන වචන භාවිතයේ ඉතා අඩු නිසා එක වචනයක් බැගින් ලිවීම සෑහේ.)

5. පහත වලාකුළු රූපයේ ඇතුළත් අක්ෂර හා අක්ෂර කොටස් පිළිබඳ ඔබේ ගුරුභවතාගේ මඟ පෙන්වීම ලබා ගනිමින් අධ්‍යයනයක යෙදෙන්න.



6. පහත 3 රූප සටහනේ 'ප' අකුරෙහි මූලික ස්වරූපයට සමාන ස්වරූප ඇති විවිධ ශබ්දවලින් යුත් අකුරු නිර්මාණය වී ඇති අයුරු විමසා බලන්න. ඒවා ශබ්ද නගා කියවන්න. එවැනි සමානත්වයක් දක්වන අකුරු, පාට භාවිත කරමින් නිර්මාණශීලී ව අඳින්න.



3. රූප සටහන

7. පහත දැක්වෙන වචන අකාරාදි පිළිවෙළට පෙළගස්වන්න.

- සුමේධ
- ආනන්ද
- ඤාණරතන
- කරුණාසේන
- විශාඛා
- පුඤ්ඤානන්ද

8 ඔබ ඉගෙන ගන්නා විෂයයන්හි නම් අකාරාදි පිළිවෙළට ලියන්න.

9 පහත දැක්වෙන්නේ 'නම් පොත' හෙවත් විහාර අස්න නමැති කෘතියෙහි මුලින් ම යෙදී ඇති වචන කිහිපයකි. ඒවා ගොනු අනුව අකාරාදි පිළිවෙළට ලියන්න.

| I ගොනුව | II ගොනුව | III ගොනුව |
| --- | --- | --- |
| • සගම | • පස්ගම | • අරත්තන |
| • මාදන්වල | • විල්වල | • කඩදොර |
| • මොරපාය | • දිඹුල | • පුසුල්පිටිය |
| • නියම්ගම්පායස්ථානය | • වල්වාසගොඩ | • සැලව |
| • අරම | • මැදිලිය | • දික්පිටිය |
| • බම්පනේ | • කාරියගම | • දඩගමුව |
| • අලුත් නුවර | • පරණ නුවර | • මාවෙල |

# 2

# නාම පද

දායකයා පින් තකා ඉඳුල් බත් අනා පන්සලේ සිටි බල්ලාට කෑමට දුන්නේ ය.

↓ ↓ ↓ ↓ ↓

පුද්ගලයකු, සංකල්පයක්, දෙයක්, තැනක්, සතකු හඳුන්වන පදයක් නාම පදයක් ලෙස සරල ව හැඳින්විය හැකි යි.

මේ අතරින් පුද්ගලයන් සහ සතුන් යනු පණ තිබෙන දෙපිරිසක් නිසා ඔවුන් හැඳින්වෙන නාම පද 'ප්‍රාණවාචී' නාම පද වශයෙන් ගැනේ. එසේ ම ප්‍රාණයක් සහිත මේ දෙපිරිසට සිතිවිලි හෙවත් චේතනා තිබෙන නිසා ඔවුන් හැඳින්වීමට 'සචේතනික' නාම පද යන නම ද යෙදේ.

දෙයක්, තැනක්, සංකල්පයක් හැඳින්වීමට යෙදෙන ඉතිරි සියලු නාම පද 'අප්‍රාණවාචී' (පණ නැති) හෙවත් 'අචේතනික' නාම පද වේ.

ඉහත උදාහරණය පරිදි දායකයා සහ බල්ලා ප්‍රාණවාචී හෙවත් සචේතනික නාම පද වන අතර පින්, බත් සහ පන්සල යනු අප්‍රාණවාචී හෙවත් අචේතනික නාම පද ය.

නාම පද පෙන්නුම් කරන තවත් ප්‍රධාන බෙදීමක් හැඳින ගැනීම අත්‍යවශ්‍ය ය. එනම් නාම පදයකින් කියවෙන ගණන නැතහොත් සංඛ්‍යාව අනුව ද ඒක වචන සහ බහු වචන වශයෙන් නාම පද බෙදා දැක්වීම යි. මෙම බෙදීම නාම පදයක සංඛ්‍යා භේදය හෙවත් වචන භේදය වශයෙන් හැඳින්වේ.

| උදාහරණ : | ඒක වචන | බහු වචන |
|---|---|---|
| | ගුරුවරයා සේවයට යයි. | ගුරුවරු සේවයට යති. |
| | මල්ලී පැළය සිටුවයි. | මල්ලිලා පැළ සිටුවති. |
| | නුඹ රූපවාහිනිය බලහි. | නුඹලා රූපවාහිනී බලහු. |
| | මම පොත ලියමි. | අපි පොත් ලියමු. |
| | සිසුවිය චිත්‍රය අඳියි. | සිසුවියෝ චිත්‍ර අඳිති. |

දෙපසින් දක්වා ඇති මෙම නිදසුන් මගින් ඒක වචන නාම පද හා ඒවා බහු වචන පද බවට පත් වන ආකාරයත් පැහැදිලි වනු ඇත.

නාම පදයක ලිංග භේදය අනුව ද වර්ගීකරණයකට ලක් කළ හැකි ය. මේ වන විටත් ඔබ දන්නා සියලු ප්‍රාණවාචී නාම පද පුරුෂ ලිංග හා ස්ත්‍රී ලිංග වශයෙන් දෙකොටසකට බෙදේ. සියලු අප්‍රාණවාචී නාම පද නපුංසක ලිංග වේ. මේ අනුව ලිංග භේදය මත නාම පද වර්ග තුනකි.

| පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග |
|---|---|---|
| ගුරුවරයා සේවයට යයි. | ගුරුවරිය සේවයට යයි. | ගස වැටේ |
| ගුරුවරු සේවයට යති. | ගුරුවරියෝ සේවයට යති. | මල් පිපේ. |
| මල්ලී පැළය සිටුවයි. | නංගී පැළය සිටුවයි. | ගඟ ගලයි. |

නාම පදවල තවත් ප්‍රධාන බෙදීමක් තිබේ. එනම් පුරුෂ භේදය යි. මෙහි පුරුෂ යනු පිරිමි යන තේරුම නොව සිටින ස්ථානය, පුද්ගලත්වය යන අදහස ය. පුරුෂ භේද තුනකි.

1 උත්තම පුරුෂ

ඉගෙනීමේ පහසුව තකා අපි ප්‍රථමයෙන් ම උත්තම පුරුෂ පද හැඳින ගනිමු. මෙහි උත්තම යනු 'ප්‍රධාන' යන අරුත්හි යෙදේ. ඕනෑ ම අයකුට පොදුවේ තමාට ලොව සිටින ප්‍රධාන ම කෙනා තමා ලෙසින් ම දැක්විය හැකි යි. එබැවින් තමා හැඳින්වෙන නාම පද උත්තම පුරුෂ නාම පද නම් වේ. උත්තම පුරුෂ ඒක වචන නාම පදය 'මම' ය.

මා සමග තවත් අය එකතු කර ගෙන 'අපි' වශයෙන් බහු වචනය තනා ගැනේ.

උත්තම පුරුෂ ගණයට වැටෙන්නේ ඉහතින් දැක්වූ මෙම නාම පද දෙක (මම සහ අපි) පමණි.

2 මධ්‍යම පුරුෂ

තමා හැරුණු කොට තමාට ඉදිරියෙන්, සමීපයෙන් සිටින අය මධ්‍යම පුරුෂ නාම පද ගණයට වැටේ.

ඒ අනුව ඔබ, නුඹ, තෝ, තී  මධ්‍යම පුරුෂ ඒක වචන වශයෙනුත් නුඹලා, තොපි, තෙපි බහු වචන වශයෙනුත් භාවිත කෙරේ.

3 ප්‍රථම පුරුෂ

තමා හා තමා අමතන ඇසෙන තෙක් මානයේ සාමාන්‍යයෙන් සිටින්නේ සුළු පිරිසකි. ඒ සුළු පිරිසට අයත් නොවන අය බොහෝ වෙති. මේ බොහෝ වූ පිරිස හැඳින්වෙන නාම පද ප්‍රථම පුරුෂ නාම පද යි. ප්‍රථම පුරුෂ නාම පද ද බොහෝ වෙයි.

හේ, ඔහු, උෟ, ඕ, ඈ, එය, ඒක, මිනිසා, වනිතාව, ගස ... යනාදි වශයෙනි. මේ ප්‍රථම පුරුෂ නාම පද ඒක වචන වන අතර ඒවා බහු වචන ගන්වන්නේ ඔවුහු, ඒවා, මිනිස්සු, වනිතාවෝ, ගස් ... ආදි ලෙසිනි.

උක්තානුක්ත භේදය යනු නාම පදවල තවත් ප්‍රධාන බෙදීමකි. ඒ අනුව උක්ත නාම පද සහ අනුක්ත නාම පද වශයෙන් කොටස් දෙකකි. මෙය පසු ව ඉගෙන ගනු ලබන විභක්ති භේදයෙහි ම එක් කොටසකි.

මම මල් කඩමි.

මෙහි මම ද නාම පදයකි. මල් ද නාම පදයකි. ආඛ්‍යාතය වන 'කඩමි' යන ක්‍රියා පදයෙන් කියවෙන්නේ (සැමවිට ම 'මම' නම් 'මි' යන්නෙන් අවසන් වේ, යන සරල රීතිය අනුව) මම බව පැහැදිලි ය. ඒ අනුව මේ වාක්‍යයේ උක්ත පදය 'මම' වේ. එමෙන් ම අනුක්ත පදය මල් ය.

සර්ව නාම යනු ද නාම පද වර්ගයකි. සර්ව යන්නෙන් 'සියලු' යන අර්ථය කියවේ. ඒ අනුව සර්ව නාම යනු සෑම නාමයකට ම පොදුවේ යෙදිය හැකි නැතහොත් ඕනෑ ම නාමයක් පොදුවේ නියෝජනය කළ හැකි නාම පද විශේෂයක් බව දැක්විය හැකි ය.

ඒ අනුව මම, අපි, ඔහු, ඇය, ඔබ, නුඹ, ඌ, එය, ඒවා ... යනාදි නාම පද සර්ව නාම වේ. මුලින් නාමයකින් හැඳින්වූ කෙනකු, සංකල්පයක්, සතකු, දෙයක් හෝ තැනක් හැඳින්වීම සඳහා පසු ව මේ සර්ව නාම යෙදිය හැකි ය.

නිදර්ශන :

පැතුම් සෙල්ලම් කරයි. ඔහු ගී ගැයීමට ද දක්ෂ යි.
ජනුනි පෙරපාසල් යයි. ඇය එහි යාමට ඉතා කැමති යි.
බෞද්ධයෝ නිවන පතති. එය ළඟා කර ගැනීමට ආර්ය මාර්ගයක් තිබේ.
සිංහල අකුරු රවුම් හැඩැති ය. ඒවා දීර්ඝ ඉතිහාසයකට අයත් ය.
බල්ලා ගෘහාශ්‍රිත සතෙකි. ඌ ස්වාමියාට ඉතා හිතවත් ය.
සීගිරිය ලොව අට වෙනි පුදුමය යි. එය විස්මිත නිර්මාණයකි.
ගංගා මුහුදට ගලා බසී. ඒවා අවට කෙත්වතු සරු කරමින් ගලා යයි.
රුවන්වැල්ල සුන්දර ගමකි. එය සබරගමුව පළාතට අයත් ය.

මේ වන විට ඔබ නාම පද වර්ග කිහිපයක් හඳුනාගන්නෙහි ය. ප්‍රාණවාචී නාම පද, අප්‍රාණවාචී නාම පද, ඒක වචන නාම පද, බහු වචන නාම පද, පුරුෂ ලිංග නාම පද, ස්ත්‍රී ලිංග නාම පද, උත්තම පුරුෂ නාම පද, මධ්‍යම පුරුෂ නාම පද, ප්‍රථම පුරුෂ නාම පද, උක්ත නාම පද, අනුක්ත නාම පද, සර්ව නාම පද වශයෙනි. මේ නාම පද ගැන ඉගෙන ගන්නා විට බොහෝ නාම පද වර්ග පැහැදිලි කිරීමට එක ම උදහරණ වචන යෙදී තිබූ බව ඔබට මතක ඇති. ඊට හේතුව ඒ උදාහරණ වචන, නාම පද වර්ග කිහිපයකට ම අයත් වීම යි.

මේ පාඩම හැඳින්වීමේ දී යොදා ගත් ආරම්භක වාක්‍යය දෙස නැවත නෙත් යොමු කරමු.

දායකයා පින් තකා ඉඳුල් බත් අනා පන්සලේ සිටි බල්ලාට කෑමට දුන්නේ ය.

දායකයා : දායකයා වූ කලී පණ ඇති මිනිසකු බැවින් මූලික ව ම මේ නාම පදය ප්‍රාණවාචී වෙයි. දෙවනු ව ඉන් කියවෙන්නේ එක් අයකු පිළිබඳ ව වන බැවින් එය ඒක වචන නාම පදයකි. තෙවනු ව ඒ පදයේ ලිංග භේදය සැලකීමේ දී එය පුරුෂ ලිංග නාම පදයකි. සිව් වනු ව එය ඉදිරියේ නැති කෙනකු හැඳින්වෙන පදයක් නිසා ප්‍රථම පුරුෂ නාම පදයක් වෙයි.

මේ අනුව දායකයා යනු, ප්‍රාණවාචී ඒක වචන පුරුෂ ලිංග ප්‍රථම පුරුෂ නාම පදයකි.


## කුසලතා වර්ධනයට:

1 (අ) ප්‍රාණවාචී නාම පද 10ක් ලියා ඉන් ඔබ කැමති පහක රූප ඇඳ දක්වන්න.


(ආ) අප්‍රාණවාචී නාම පද ද 10ක් ලියා ඒ අතරින් ඔබ කැමති නාම පද පහක් සඳහා අදාළ රූප ඇඳ දක්වන්න.

(අ) එම රූප දෙස බලා අදාළ නාම පදය කියවෙන වාක්‍ය දෙක බැගින් ලියා දක්වන්න.

2 පන්සල් බිමක දැකිය හැකි දෑ අතරින් නපුංසක ලිංග නාම පද යටතට ගත හැකි දේවල් තෝරන්න. පහත රූපය පරිදි දෙපසට බෙදුණු කුඩා රේඛා සහිත බුලත් කොළයක් ඇඳ බුලත් කොළයේ රේඛා මත එම නපුංසක ලිංග නාම පද ලියා දක්වන්න.



3 මීත් පිරිමි රූපය තුළ පුරුෂ ලිංග නාම පද 10ක් ලියන්න. ගැහැනු රූපය තුළ ස්ත්‍රී ලිංග නාම පද 10ක් ලියන්න.



4 (අ) වරහන් තුළ ඇති පද අතුරෙන් සුදුසු පද යොදා පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i. ........................................ ගෙදර යයි. (ඔවුහු, ඔහු)

ii. ........................................ චිත්‍ර ඇන්දෝ ය. (ළමයා, ළමයි)

iii. ........................................ ගීයක් ගැයුවෙහි. (තුඹලා, තුඹ)

iv. ........................................ ශ්‍රමදානයෙහි යෙදෙත්තාහු (තෝ, තෙපි)

v. ........................................ පොත් කියවති. (ඔබ, තෙපි)

vi. ........................................ චිත්‍රපටය බැලුවෙමි. (මම, අපි)

vii. ....................................... ජය පැතීමි. (නුඹ, මම)

viii. ....................................... කුඹුරු කොටති. (ඔහු, ඔවුහු)

ix. ....................................... වැඩ කරහු. (නුඹලා, අපි)

x. ....................................... වගා කරති. (ඔවුහු, ඔහු)

(ආ) ඉහත (අ) කොටසේ වරහන් තුළ යෙදූ නාම පද පහත සටහන තුළ ලියා - ඒවා පහත කොටුවල අදාළ පරිදි (√) හරි ලකුණ යොදන්න.

| නාම පදය | ජීව වාචී | අජීව වාචී | ඒක වචන | බහු වචන | පුරුෂ ලිංග | ස්ත්‍රී ලිංග | නපුංසක ලිංග | උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| උදා - ඔවුහු | √ | | | √ | | | | | | √ |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

5 (අ) සුදුසු සර්ව නාම පද යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. කුත්තිරි ගස ද ගසකි. ................... බෙහෙතට ගැනේ.

ii. අපි පැළ සිටවමු. ................... වැඩුණු පසු මිනිසා ඇතුළු සතුන්ට බොහෝ ප්‍රයෝජන ලැබේ.

iii. ගවයා සිවුපාවෙකි. ................... මිනිසාට විවිධාකාරයෙන් උපකාර වෙයි.

iv. මෙරට දක්ෂ බෞද්ධ යතිවරු සිටියහ. ................... ග්‍රන්ථ කරණයෙහි යෙදුණාහ.

v. සරසි බුද්ධිමත් දැරියකි. ................... නිතර පොත්පත් කියවයි.

6 පහත කවි පෙළ කියවා, පින්තූර බලා අදහස වටහා ගන්න.



## පින් සිදු වන්නේ...

පින් සිදු වන්නේ - අනේ බාල ළමුන්නේ
මගේ කුඩා නිවස කඩා - බිම නොදමන්නේ

වනේ පුරා සොයා ගොසින් කෝටු කඩාලා
කුඩා කුඩා කැබලි තුඩින් මෙහි ගෙනවිල්ලා
ගසේ මුදුන් අත්ත උඩින් කෝටු තබාලා
උදේ පටන් දවස පුරා කූඩු තනාලා

කොළේ කොළේ දමා කුඩා නිවස සදන්නේ
මගේ දයා බිරිඳ නිතර එය සරසන්නේ
රැලේ රැලේ පුළුන් දමා යහන සදන්නේ
අගේ මටයි ළදරුවනේ, එය නොකඩන්නේ

මෙදා මගේ නිවස ඇතා සතුට වඩාලා
උදාර වූ කිරිල්ලගේ දරුවෝ පිරිලා
ඒදා අනේ අපට ගලෙන් ගැසුව සියල්ලා
වැදා කියමි මගේ පුතුන් හෙම නොමරල්ලා

දෙමාපියන් සෙනේ වෙතේ තම දරුවන්ටා
ළමා ඔබෙන් අපට නැතේ මිහි පිට ඉන්ටා
සමා වෙලා මෙඅප වෙතේ දිවි රැක ගන්ටා
නමා යදිමි දෙන්න අනේ, මෙතන රැඳෙන්ටා

*- ආර්. එන්. එච්. පෙරේරා*





(අ) නිල් පැහැයෙන් දක්වා ඇති වචන අභ්‍යාස පොතේ පිළිවෙළට එක යට එක ලියා ඉදිරියෙන් ඒවා ඒක වචන ද, බහු වචන ද යන්න ලියා දක්වන්න.

උදාහරණ : 1. පින් - බහු වචන

(ආ) රෝස පැහැයෙන් දක්වා ඇති වචන ද එක යට එක ලියා ඒවා ඉදිරියෙන් ඒවා ප්‍රාණවාචී ද අප්‍රාණවාචී ද යන්න ලියා දක්වන්න.

උදාහරණ : 1. නිවස - අප්‍රාණවාචී

(ඇ) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1). මෙම කවි පන්තිය ලියවී ඇත්තේ කාගේ ඉල්ලීමක් විලසින් ද?

**1. කුරුල්ලකුගේ** **2. කිරිල්ලියකගේ**

2). මෙම කුරුලු නිවසෙහි අගය ඇත්තේ කාට ද?

**1. කුරුල්ලාට** **2. ළමයින්ට**

3). මෙම කවි පන්තිය අනුව දෙමාපියන් සෙනෙ වන්නේ කවුරුන්ට ද?

**1. තම දරුවන්ට** **2. කුරුල්ලන්ට**

4). කුරුල්ලා කූඩු තැනීමට කෝටු කැලි රැගෙන එන්නේ කුමකින් ද ?

**1. තමාගේ තුඩිනි** **2. තමාගේ පිහාටුවලිනි**

5). උදේ සිට මහන්සි වී කුරුල්ලා තනන කූඩුව සරසන්නේ කවුරුන් විසින් ද?

**1. කිරිල්ලිය විසිනි** **2. ළමයින් විසිනි**

6). කුරුල්ලාට සිය පවුලත් සමග මිහිපිට සිටීමට බාධා කරන්නේ කවුරු ද?

**1. ළමයින්** **2. කිරිල්ලිය**

7). මෙම කුරුල්ලන්ට ගල් ගසා ඇත්තේ කවුරුන් ද?

**1. තවත් කුරුල්ලෙක්** **2. ළමයින්**

8). කුරුල්ලා වඳිමින් ඉල්ලා සිටින්නේ කවුරුන් නොමරන ලෙස ද?

**1. සිය පුතුන්** **2. දෙමාපියන්**

9). මෙම කුරුල්ලාගේ නිවසේ මෙදා වඩාලා ඇත්තේ මොනවා ද?

**1. කෝටු කෑලි** **2. සතුට**

10). 'තමා යදිමි දෙන්න අනේ, මෙතන රැඳෙන්ටා' යනුවෙන් ඉල්ලා සිටින්නේ කාගෙන් ද?

**1. වත්ත අයිතිකරුවන්ගෙන්** **2. ළමයින්ගෙන්**

(ඈ) කුරුල්ලන් පිළිබඳ කියවෙන කතන්දරයක් සොයා දැනගන්න. ගුරුභවතාගේ අවසරය පරිදි පන්තිය ඉදිරියේ අන් අයට ද කියා දෙන්න.

(ඉ) ජාතක පොතේ එන, සමගියේ බලය පෙන්වන වටු කුරුල්ලන්ගේ කතාවේ ඔබ සිත් ගත් එක් අවස්ථාවක් සිතුවමට නගන්න.

(ඊ) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරක කුරුල්ලන්ගේ නම් කිහිපයක් ලියන්න

(උ) ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියාගේ නම ලියන්න. එම කුරුල්ලා පිළිබඳ වාක්‍ය පහක් ලියන්න.

(ඌ) කුරුල්ලන් පිළිබඳ රසවත් හැඟුම්බර ගීත, කවි, සිතුවම් එකතු කර කුඩා පොතක් හදන්න.

(එ) එම පොතෙහි අග කොටසේ කුරුල්ලන්ට හිංසා නොකර එම සතුන් රැක බලා ගැනීම සඳහා කළ යුතු දෑ ලියා දක්වන්න.

7 පහත ඡේදය කියවා, අදහස වටහාගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

"…. රාත්‍රි දෙකට පමණ මාහිමියන් වහන්සේගේ කාමරය අසලින් ගමන් කළ ශිෂ්‍යයන් දෙදෙනකුට කාමරය තුළින් කෙඳිරිලි හඬක් ඇසුණේ ය. ශිෂ්‍යයෝ දෙදෙන ඒ ශබ්දයට කන් යොමු කරමින් කාමරයේ දොර අසලට ම පැමිණ මොහොතක් කන් දී සිට ශබ්දය මාහිමියන් වහන්සේගේ ම බව දැන ගත් වහා ම කලබලයට පැමිණ දොරට තට්ටු කළහ. කථාවක් නැත. ඉවසුම් රහිත ව ඔවුහු අනික් දොර ළඟට ද දුව ගියහ. දොරට තට්ටු කළ නමුත් කෙඳිරිය මිස කාමරය තුළින් එන ශබ්දයක් නොනික්මුණේ ය. කාමරයේ අප්‍රධාන දොර දෙපළු දොරකි. ඒ දොර පළු එකතු වන තැන දිගට ම කුඩා විවරයකි. ඒ විවරයෙන් ඒ දෙනම යන්තම් එබී බැලූහ. නිතර දැල්වෙන පහන නිසා කාමරය තුළ ඒ විවරය කෙළින් ම තිබෙන යමක් දැක්ක හැකි තරම් විය. විවරයෙන් පෙනුණේ මාහිමියන් වහන්සේ බිම වැටී හිඳින බව ය.

එසේ වැටී හිඳිනු දැකීමත් කාමරයෙන් නික්මෙන පීඩිත ශබ්දය ඇසීමත් ශිෂ්‍ය දෙපළ සිහි නැති කරවීමට තරම් ප්‍රබල විය. දෙදෙන ම දොර අරින්ට උත්සාහ කළ නමුත් නොහැකි විය. එයින් නොනැවතුණු ඒ දෙදෙන ස්වකීය හෘදය විදාරණය වීමට කලින් ද්වාරය විදාරණය කළහ. හැකි පමණ වෙර වඩා දොරට පයින් ගැසූහ. දොර විවෘත වීමත් සමග ම ඒ දෙදෙනා ගෙට පැන ළං ව මාහිමියන් ඔසවා ඇඳේ තබා ආර්ත ස්වරයෙන් කෑ ගැසූහ. මාහිමියන් වහන්සේගේ ශරීරයේ පැත්තක් අප්‍රාණික ව මෙන් පවතිනු දැකීම නිසා අතිශය භීතියට පත් ව ඒ දෙදෙන වඩාත් කෑ ගැසූහ. මධ්‍යම රාත්‍රියෙහි වූ ඒ කෑ ගැසීම නිසා බොහෝ දෙන අවදි ව දුව අවුත් කාමරයට වැදුණෝ ය ."

- ශ්‍රී සුමංගල චරිතය

(අ) කාමරය තුළින් කෙඳිරිලි හඬක් ඇසුණේ රාත්‍රි කීයට පමණ ද?

(ආ) ශිෂ්‍යයන් දෙදෙනා කලබලයට පත් වූයේ හරියට ම කුමක් දැන ගත් නිසා ද?

(ඇ) දොරට තට්ටු කළ විට ඇසුණු හඬ කුමක් ද?

(ඈ) දොරපළු එකතු වන තැන දිගට ම ඇත්තේ කුමක් ද?

(ඉ) ශිෂ්‍ය දෙනම දොරෙහි වූ විවරයෙන් බැලූ කල දුටුවේ කුමක් ද?

(ඊ) ශිෂ්‍ය දෙපළ විසින් සිය හදවත් විදාරණය වීමට කලින් විදාරණය කළේ කුමක් ද?

(උ) ඉහත උද්ධෘතයේ ඉරි ඇඳි පද ලියා ඒ ඉදිරියෙන් ඒවායේ අදහස ලියන්න.

(ඌ) ඉහත (උ) පැනයට පිළිතුරු සෙවීමේ දී ගුරු භවතාගේ මග පෙන්වීම මත වදන්වල අර්ථ සොයා ගැනීමට ශ්‍රී සුමංගල ශබ්දකෝෂය පරිශීලනය කරන්න.

(එ) ඉහත උද්ධෘතය හා ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය අතර සම්බන්ධය පිළිබඳ ඔබේ ගුරු භවතා විමසා දැනගන්න.

3

# ක්‍රියා පද

නටමින්, ගය ගයා, ඇවිදියි, උයා, වැටේ.

ඉහතින් දක්වා ඇත්තේ පසුගිය පාඩමෙහි දී ඔබ උගත් නාම පද විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් හෙවත් හැසිරීම් කිහිපයකි. ඒවා ක්‍රියා පද වශයෙන් නම් කළ හැකි ය. එම ක්‍රියා පද ඔබ උගත් නාම පද සමග යෙදෙන ආකාරය පහත උදාහරණ මගින් විමසා බලන්න.

1 මල්ලී නටමින් . . . 3 ගුරුවරයා ඇවිදියි

2 නුඹ ගය ගයා. . . 4 මම උයා. . . 5 ගස වැටේ.

මෙහි අංක එකෙන් දැක්වෙන 'මල්ලී නටමින් . . .' යනු අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩයක් බව පෙනේ. එය මල්ලී නටමින් ඇවිදියි, යනාදී වශයෙන් තවත් ක්‍රියා පදයක් එකතු වී සම්පූර්ණ විය යුතු ය. නැතිනම් වාක්‍යයේ නිමාවක් නැත. නුඹ ගය ගයා. . .හා මම උයා. . . යනු ද එවැනි ම අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩ දෙකකි. එහෙත්,

3 ගුරුවරයා ඇවිදියි. 5 ගස වැටේ.

යනු තේරුමක් හා නිමාවක් සහිත සම්පූර්ණ වාක්‍ය දෙකකි. එහි යෙදුණු නාම පදවලට ඒ නිමාව හෙවත් පූර්ණත්වය ලැබුණේ අගට යෙදුණු ක්‍රියා පදයෙනි. එම ක්‍රියා පද අවසාන ක්‍රියා පද වශයෙන් හැඳින්වේ. අවසාන ක්‍රියා පද ආඛ්‍යාත පද වශයෙන් ද හැඳින්වේ. මෙම පාඩමේ දී අවධානය යොමු කරන්නේ එම අවසාන ක්‍රියා පද කෙරෙහි පමණි. ඉහත අසම්පූර්ණ වාක්‍ය ඛණ්ඩවල යෙදුණු නටමින්, ගය ගයා, උයා වැනි ක්‍රියා පදවලට අවසාන ක්‍රියා පද යැයි නොකියමු. ඒවා ඉදිරි කාලයේ දී ඉගෙනීමට ලැබෙනු ඇත. ඒ අනුව නාම පදයකට එකතු වී වාක්‍යයකට පූර්ණත්වයක් සමග ම නිමාවක් ලබා දෙන පද, අවසාන ක්‍රියා පද වශයෙන් සරල ව වටහා ගත හැකි ය.

නාම පදවලට හා ක්‍රියා පදවලට ද පොදු වර්ගකිරීම් සේ ම ක්‍රියා පදවලට පමණක් විශේෂ වූ බෙදීම් ද හැඳිනගත හැකි ය. ඒනෑ ම ක්‍රියා පදයක් සකසා ගන්නා මූලික ශබ්ද ගණනාවක් සිංහල භාෂාවේ ඇත. ඒ මුල් ම ශබ්ද ස්වරූපවලට 'ක්‍රියා ප්‍රකෘතිය' හෙවත් 'ධාතුව' යන නාම යෙදේ. ලියයි යන්නෙහි 'ලිය' කපයි යන්නෙහි 'කප' ආදි වශයෙනි. ධාතුවකට විවිධ ප්‍රත්‍යය එකතු වීමෙන් ක්‍රියා රූප සෑදෙන බව සිත්හි තබා ගන්න.

ගුරුවරයා ඇවිදියි.

මෙහි 'ඇවිදියි' යන අවසාන ක්‍රියා පදයෙන් මේ මොහොතේ සිදු වන ක්‍රියාවක් පිළිබඳ කියවෙයි. එය අනාගතයේ වීමට ද ඉඩ තිබේ. මෙවැනි ක්‍රියා පද සම්බන්ධයෙන් වර්තමාන අනාගත වෙනස දක්වන්නේ, අනාගතය දැක්වීම සඳහා 'මතු' හෝ ' හෙට' යනාදි කාලයක් දැක්වෙන වචන ක්‍රියා පදය සමග යොදා ගැනීමෙනි.

උදා : ගුරුවරයා මතු ඇවිදියි. /ඇවිදින්නේ ය.
ගුරුවරයා හෙට ඇවිදියි. /ඇවිදින්නේ ය.

අවසාන ක්‍රියා පදයකට අතීත කාලයක් ද තිබේ.
උදා : ගුරුවරයා ඇවිද්දේ ය.

ආඛ්‍යාත පදවල ඒක වචන, බහු වචන භේදය මෙන් ම උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ යන පුරුෂ භේදය වැනි බෙදීම් ද තිබේ.

රකියි, රකිති යනාදි වශයෙන් මෙම ක්‍රියා පද සෑදීමට මුල් වන 'රක් ' යන මූලික ශබ්දය හෙවත් ධාතුව උදාහරණයට ගනිමු.

වර්තමාන කාලය

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : | රකිමි | රකිමු |
| මධ්‍යම පුරුෂ | : | රකිහි | රකිහු |
| ප්‍රථම පුරුෂ | : | රකියි | රකිති |

## අතීත කාලය

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : | රැකීමි | රැකීමු |
| මධ්‍යම පුරුෂ | : | රැකීහි | රැකුහු |
| ප්‍රථම පුරුෂ | : | රැකී | රැකූ |

## අනාගත කාලය

| | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|
| උත්තම පුරුෂ | : (හෙට) | රකිමි/රකින්නෙමි | රකිමු/රකින්නෙමු |
| මධ්‍යම පුරුෂ | : (හෙට) | රකිහි/රකින්නෙහි | රකිහු/රකින්නෙහු |
| ප්‍රථම පුරුෂ | : (හෙට) | රකියි/රකින්නේ ය | රකිති/රකින්නෝ ය |

අවසාන ක්‍රියා පද සකර්මක, අකර්මක වශයෙන් ද බෙදේ. සකර්මක යනු කර්මයක් සහිත යන තේරුම යි. එසේ ම 'කර්මයක් නැති' යන අරුත ඇති ව අකර්මක නම යෙදී තිබේ.

අකර්මක ක්‍රියා පද සඳහා පහත උදාහරණ පිරික්සන්න.

මල්ලී වැටෙයි. තරු පායයි.
කුකුළා හඬලයි. වැස්ස වසියි.
තාරාවෝ ඉගිලෙති. දරුවෝ හඬති.

මේ වාක්‍යවල උක්ත වන නාම පදය හැර අවසාන ක්‍රියාවට යටත් වන වෙනත් නාම පද නැතහොත් කර්ම පදයක් නැත. එහෙත් වාක්‍යයේ අර්ථයට හානියක් ද නැත. ඉහත උදාහරණ හය ම එවැනි අකර්මක ක්‍රියා පද සහිත ඒවා ය.

පහත වාක්‍ය දෙස බලන්න.

මල්ලී කයි. අක්කා ලියයි. නුඹ ඇසුවෙහි.

වාක්‍යයක යෙදී තනි ව ම පූර්ණ අදහසක් ප්‍රකාශ කිරීමට අපොහොසත් වන, ඒ සඳහා කර්ම පදයක් අපේක්ෂා කරන අවසාන ක්‍රියා පද හෙවත් ආඛ්‍යාත පද සකර්මක ක්‍රියා පද වේ.

ඉහත දැක්වූ අසම්පූර්ණ වාක්‍ය, කර්මයක් යොදා සම්පූර්ණ කළ හැකි ආකාර දෙක සසඳා බලන්න.

| | | |
|---|---|---|
| මල්ලී බත් කයි. | අක්කා ලිපියක් ලියයි. | නුඹ බණ ඇසුවෙහි. |
| මල්ලී කැවුම් කයි. | අක්කා මැල්ලුම් ලියයි. | නුඹ ගීයක් ඇසුවෙහි. |

අවසාන ක්‍රියා පදයක තවත් වර්ග කිරීමක් නාමාඛ්‍යාත යනුවෙන් දැක්වෙයි. නාමාඛ්‍යාත යන පදය දෙස බැලූ විට ම එය නාමයක් සහ ආඛ්‍යාතයක් යන වචන දෙක ම ඇතුළත් පදයක් බව පෙනේ. නාමයක් යනු කුමක් ද, ආඛ්‍යාතයක් යනු කුමක් ද කියා මේ වන විට ඔබ දන්නෙහි ය. නාමාඛ්‍යාත කිහිපයක් උදාහරණ ලෙස පහත දැක්වේ.

මම සිසුවියක්මි.
ඔහු ගුරුවරයෙකි.
ඌ කුරුමිණියෙකි.
උදේනි යුවතියකි.
එය පොතකි.
මෙය පෑනකි.
අන්නාසි පලතුරකි.

# කුසලතා වර්ධනයට:

1. බුද්ධ පූජා පැවැත්වීමේ දී ආහාර, ගිලන්පස, දැහැත්විට . . . යනාදි වශයෙන් ඔබ විසින් පූජා කරන ලද දේවල් වර්ග පහක් ඇතුළත් කර වාක්‍ය පහක් තනන්න.

2. බුද්ධ පූජා පැවැත්වීමේ දී ඉදිරි කාලයේ දී යම් යම් දේ පූජා කරමි, යන අදහසින් ඒ පූජා භාණ්ඩ සඳහන් කර වාක්‍ය 10ක් ලියන්න.

3. ඔබේ යහළුවන් හා හිතවතුන් ඔබ සමීපයේ නොමැති අවස්ථාවල දී යම් යම් වැඩවල, ක්‍රියාකාරකම්වල නිරත වන බව ඔබ දන්නෙහි ය. ඔබට නොපෙනුණත් ඔවුන් මේ අවස්ථාවේ දී කරමින් සිටිනවා ඇතැයි ඔබ සිතන ක්‍රියාවන් යොදා වාක්‍ය 10ක් නිර්මාණය කරන්න. එම වාක්‍ය වර්තමාන කාලයට අයත් වීම අවශ්‍ය ය.

   උදාහරණ : සෝභිත පොඩි හාමුදුරුවෝ දහම්පාසල් සිසුන්ට පන්සිල් දෙති.
   සෝමසිරි උපාසක මහතා දැහැත්විට පූදානම් කරයි.

4. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

*"හිරු නැගෙන හැටිත් බැස යන හැටිත් දිනපතා ම මම දකිමි. දහවල් වන විට අවට වාතය ගිනියම් වී මගේ පිට සම හිරු රැසින් රත් වෙයි. මා වසා සිටින අඳුරු වන ගැබ තුළින් සර සර ගාන හඬවල්, සිහින් කෙඳිරිලි දිවා රෑ දෙකේහි ම ඇසෙයි. හිරු නැගී එන විට දීප්තිමත් ව බබළන පහනකින් මෙන් ගන රන් ආලෝකයක් අහස පුරා පැතිර යයි. කුඩා කඳු ගැට දෙකක් මා අසලින් පිහිටා සිටින්නේ දිවා රෑ නොනකා රැකවල් ලා සිටිනවුන් දෙදෙනකු මෙනි. ජෙන තෙක් මානයේ හැම පැත්තෙන් ම කුඩා කඳු ගැට වසාගෙන ඝන වනය ඈතට විහිද යයි. එහෙත් ඈතින් පෙනුණු ඇතැම් උස කඳු මුදුන් නිලට හුරු කොළ පැහැයක් ගන්නේ ය. ඇතැම් කඳු මුදුන් ඇති බව වත් නොපෙනෙන තරම් ය. විටෙක වන හිස අඹරවාගෙන හමන තද සුළඟින් වන පෙදෙස ඝෝෂාවක් වෙයි. සුළං පහර කොතරම් දැඩි වුව ද මගේ ඇඟේ හැපී පැරද ආපසු හැරී පලා යයි. වියළී පැරණි ගසක පිට සුඹුලු ගැලවෙන්නාක් මෙන් මගේ පිට සමින් පතුරු ගැලවී පා මුලට ඇද වැටෙයි. විශාල කුට්ටි ද වැටුණු අවස්ථා එමට ය."*

- සීගිරිය අවදියෙන් - එල්. බී. හේරත්

(අ) මෙම ඡේදයේ දැක්වෙන අවසාන ක්‍රියා පද හතක් තෝරා ලියා දක්වන්න.
(ආ) එම ක්‍රියා පද අතීත කාලයට හරවා ලියා දක්වන්න.
(ඇ) මෙම ඡේදයේ දැක්වෙන ඉරි ඇඳි වාක්‍යයෙන් කියවෙන අදහස විචිත්‍රවත් ව ඇඳ දක්වන්න.
(ඈ) මෙම ඡේදයේ දැක්වෙන නාම පද හතක් තෝරන්න.
(ඉ) මෙහි (අ) ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තේරූ අවසාන ක්‍රියා පද හත සහ (ඈ) ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තේරූ නාම පද හත සම්බන්ධ කර කෙටි වැකි හතක් තනන්න.

5. පහත සටහන කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

### වඩු කුරුල්ලා



ගහක් ඉහළ ගෝමේට් එල්ලෙන සැට්ය
හොඳක් වෙයි දෝ කන්නෙට වඩුවගෙ සැට්ය
මෙදක් වැස්ස ආවොත් වැඩි වැඩිය
කැඳක් මොකට කුඹුරේ අස්වනු වැඩිය



වඩු කුරුල්ලා කූඩු හදන්නේ සාමාන්‍යයෙන් වැව් ආශ්‍රිත ගස්වල යි. මේ කුරුල්ලන් ගහේ පහළ ම අතුවල කූඩු හදා ඇත්නම් ඉඩෝර කාලය වැඩි ය. මැද හරියේ නම් මධ්‍යස්ථ ඉඩෝරයකි. (යහපත් කාලගුණයක්) ඉහළ ම අතුවල නම් අධික වර්ෂාවක් ලැබේ. (බිත්තර රැකීම සඳහා වායුගෝලයේ ආර්ද්‍රතාව බලපායි. ආර්ද්‍රතාව අඩු වීමටත් හොඳ නැත; වැඩි වීමටත් හොඳ නැත. අවශ්‍ය නියමිත තත්ත්වය රැක ගැනීමට මේ කුරුල්ලෝ මෙම උපක්‍රමය භාවිත කරති.)

- සොබාදහම් ගොවිතැන - *පරිසරවේදී තිලක් කන්දේගම*

අ) '... ගෝටේ එල්ලෙන            සැටිය' යනුවෙන් කුමක් අදහස් වේ ද?

(ආ) 'කැඳක් මොකට කුඹුරේ අස්වනු            වැඩිය' යන කවි පේළියේ අදහස සොයා ලියන්න.

(ඇ) මෙම ඡේදයේ දැක්වෙන පරිදි ඉදිරියේ දී ඉඩෝරයක් පැමිණේ නම් වඩු කුරුල්ලා කූඩුව තනන්නේ කොයි ආකාරයෙන් ද?

(ඈ) වඩු කුරුල්ලාට ඒ නම ලැබී ඇත්තේ කුමක් නිසා දැයි විමසා දැනගෙන ලියා දක්වන්න.

(ඉ) වඩු කුරුලු කූඩුවක් නිරීක්ෂණයෙන් මේ කුරුල්ලා කූඩු තැනීමේ දී දක්වන නිර්මාණාත්මක දක්ෂතා කිහිපයක් සඳහන් කරන්න.

(ඊ) වැස්ස පිළිබඳ පෙරනිමිති පෙන්වන වෙනත් සතුන් කිහිප දෙනකුගේ නම් ලියන්න.

(උ) පහත වැකිවල අවසාන ක්‍රියා පද තෝරන්න.

1 හදිසි වැස්සකට පෙර කළු කූඹි සිය බිත්තරත් රැගෙන මිනිසුන්ගේ නිවෙස්වලට පැමිණෙති.
2 කපුටු කූඩුවේ බිත්තර දෙකකට වඩා වැඩි නම් වැඩි වැස්සක් ලැබේ.
3 හලංපෙන්දා සහ අව්ව්වියා දුටු විට වැස්ස ළඟ බව ගොවියෝ දනිති.
4 කක්කුටු වළවල් පරීක්ෂා කිරීමෙන් ඉදිරියේ දී කොපමණ ප්‍රමාණයක වැස්සක් ලැබේවි ද යන්න පැවසීමට තරම් දක්ෂ ගොවියෝ සිටිති.
5 නියඟයක් පවතින තාක් නියඟලා, අල වශයෙන් ම පවතී.

# 4

# වාක්‍ය නිර්මාණය

"සැලේ ළා සෙමෙන් දලු බෝපත් "

ඉහත උද්ධෘතයෙහි දක්වා ඇත්තේ වචන එකතුවක් බව පෙනේ. එම වචන කියවූ විට නිශ්චිත අර්ථයක් වටහා ගැනීමට නොහැකි ය. එහෙත් එම වචන ම,

"ළා දලු බෝපත් සෙමෙන් සැලේ "

යනුවෙන් ලියූ විට අපට යම් අර්ථයක් වටහා ගත හැකි ය. එමෙන් ම එය ප්‍රකට බොදු ගීයක පද පේළියක් ද සිහියට කැඳවයි.

එක ම වචන එකතුවක් මුලින් ම පැවසූ ආකාරයෙන් නොවැටහීමටත් දෙවනු ව කී ආකාරයෙන් වැටහීමටත් හේතුව කුමක් ද? එයට හේතුව වචන පෙළගැස්මේ පිළිවෙළ යි. ඒ අනුව පිළිවෙළ වැරදුණු විට අර්ථය නොවැටහෙන නිසා, වචන යම් පිළිවෙළකට රටාවකට ගැළපීමෙන් අර්ථවත් වාක්‍යයක් නිර්මාණය වන බව අවබෝධ කර ගත හැකි යි.

වාක්‍ය නිර්මාණයේ දී මේ වචන ගැළපීම් රටාව, ව්‍යාකරණ නීති රීති වශයෙන් විධිමත් ව හැඳිනගත හැකි ය. පහත වැකි ඒ සඳහා නිදසුන් ය.

නංගී දුවයි
හිරු නැගෙයි
බල්ලා බුරයි
සුළං හමයි

මෙම වැකිවල උක්තයක් (අවසාන ක්‍රියාවෙන් කියවෙන නාම පදය) සහ අවසාන ක්‍රියාවක් තිබේ. තිබෙන්නේ එපමණකි. එහෙත් අරුත හොඳින් පැහැදිලි ය. පෙර පාඩමේ දී උගත් පරිදි මේවා අකර්මක වාක්‍යය වේ. පහත වාක්‍ය දෙස බලන්න.

මම පන්සිල් ගනිමි
නුඹලා අකුරු ලියනු
දැරියෝ ගී ගයති

මෙම සරල වාක්‍ය තුනෙහි උක්ත නාම පදයට හා අවසාන ක්‍රියා පදයට අමතර ව තවත් නාම පදයක් තිබේ. එය කර්ම පදය වේ. උක්ත නාම පදයෙන් කර්ම පදයට යෙදෙන නාම පදය වෙන් කර හැඳින ගන්නේ අවසාන ක්‍රියා පදය දෙස බැලීමෙනි. අවසාන ක්‍රියා පදයෙන් කියවෙන පදය උක්ත වන අතර අවසාන ක්‍රියා පදයට යටත් වන අනෙක් නාම පද කර්ම පද වේ.

ඉහත පළමු වෙනි නිදසුන් වැකියේ උක්තය (මම) හා අවසාන ක්‍රියාව (ගනිමි) යන පද දෙක ම ඒක වචන හා උත්තම පුරුෂ වන බව පැහැදිලි වනු ඇත.

දෙවෙනි වාක්‍යයයේ උක්තය (නුඹලා) සහ අවසාන ක්‍රියාව (ලියහු) යන පද දෙක ම බහු වචන හා මධ්‍යම පුරුෂ වන බව පෙනේ.

තෙවෙනි වාක්‍යයේ ද උක්තය (දැරියෝ) සහ අවසාන ක්‍රියාව (ගයති) යන පද දෙක ම බහු වචන හා ප්‍රථම පුරුෂ වෙයි.

මේ අනුව උක්තයට අනුව අවසාන ක්‍රියාවත් අවසාන ක්‍රියාවට  අනුව උක්තයත් තිබිය යුතු බව පෙනේ. මේ සම්බන්ධය මනා ව වටහා ගත් විට සරල වැකියක් තැනීමට ඔබට හැකියාව ලැබේ. ඒ ඔස්සේ කුඩා වාක්‍ය නිර්මාණය කර, ඒවා එකිනෙක සම්බන්ධ කර දිගු වැකි තැනීමටත් ඔබට ක්‍රමයෙන් උගත හැකි ය. වාක්‍ය නිර්මාණය හා අවබෝධය පිළිබඳ මේ වන විටත් ඔබට යම් කුසලතාවක් තිබේ. මේ පාඩම කියවා ඔබ තේරුම් ගන්නේ ද වාක්‍ය පිළිබඳ යම් දැනුමක් ඔබ සතු බැවිනි.

පහත වැකි දෙස ද අවධානය යොමු කරන්න.

<u>මල් පිපෙයි.</u>
සුනාමි ව්‍යසනයෙන් බොහෝ <u>ගෙවල් විනාශ විය.</u>
<u>දුම්වැටි</u> ටිකෙන් ටික මිනිසුන් <u>මරා දමයි.</u>
වැව් දිය මත <u>මල් පෙති පාවේ.</u>

මෙම වැකිවල උක්ත පදයෙහි ඒක වචන, බහු වචන භේදයක් නොසලකා අවසාන ක්‍රියා පදය ඒක වචනයෙන් ම යෙදී ඇත. අප්‍රාණවාචී හෙවත් අචේතනික නාම පද ඒක වචන වුව ද බහු වචන වුව ද අවසාන ක්‍රියා පදය පොදුවේ යෙදෙන්නේ ඒක වචනයෙන්  ය.

# කුසලතා වර්ධනයට:

1 සුදුසු පද වරහන් තුළින් තෝරාගෙන පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i කුහුඹුවා වේගයෙන් ගමන් .......................... (කරති/කරයි)

ii කුරුල්ලෝ අහසේ පියාසර .......................... (කරති/කරයි)

iii .......................... දශක තුනකට පසු නාගදීපය වැඳීමට ගියහ. (ඔවුහු/ඔවුන්)

iv තෝ කුමක් .......................... (කළෙහි/කළෙහු)

v .......................... ගීතයකට සවන් දෙමු. (අපි/මම)

vi නුඹලා දහම් පාසල් .......................... (ගියෙහි/ගියෙහු)

vii කිළිලියෝ මනහර රැඟුමක් .......................... (පෙන්වයි/පෙන්වති)

viii .......................... දියෙහි පීනයි (කිඹුලා /කිඹුලෝ)

ix සරුංගලය වේගයෙන් ඉහළ .......................... (යයි /යති)

x .......................... මුහුදට ගලා බසී. (ගංගාවෝ/ගංගා)

2 පහත සඳහන් අර්ථය අපහැදිලි වාක්‍යවල පද මාරු කර අර්ථවත් වාක්‍ය තනන්න. ඔබේ අභ්‍යාස පොතේ මෙහි දක්වා ඇති රූපය අඳින්න. තනාගත් අර්ථවත් වැකි ඒ තුළ ලියන්න.

i කුඹුර ගොවියා කොටයි.

ii දෙසත් නාහිමියෝ දහම්

iii ද කරමු අපි කුමක් ?

iv කවයි මල්ලීට අම්මා බත්.

v නොබැඳේ පෙරළෙන පාසි ගලේ

vi පුදමි නෙළුම් මම මල්

vii රජවරු දෙති දන්

viii පැන යති පැන හාවෝ

ix ව්‍යසනය දකිමු පිටු දුම්කොළ

ix තුම්යකි අභය පන්සල



3 (අ) එක් රූප රාමුවකට ගැළපෙන සරල වාක්‍ය තුන බැගින් ලියන්න.

(අ) රූප රාමු දෙකට ම අදාළ වන සරල වාක්‍ය දෙකක් ලියන්න.





4 පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

## අලි දළ උගුළන හැටි

හිවල් හාමි කෙලින් ම ගියේ ගොවි හාමි සමු වන්නට ය. එහෙත් කෙසේ සමු විය හැකි ද? ගොවි ගෙදරට යෑම නො සිතිය හැකි ය. ගොවි ගෙදර තිබියේ වා, ගොවි පළේ මායිමට ළං වීම ද සනීපයට හොඳ නො වේ. ඇයි? අර කරදර කාර බලු හාමි හැම තැන ම පෙනේ. හොඳ සුවඳක් ලද්දා සේ නාසය බිම ඔබා-ගෙන දුවන බලු හාමිට හිවල් හාමි අසලකට වත් පැමිණිය හොත් වහා දැනෙයි. ඉහින් ළඟට වත් එන්නේ කෙසේ ද?

හිවල් හාමි බොහෝ වේලා ඒ මේ අත ඇවිද්දේ ය. ඒ ඇවිද්දේ කොහි ද? ගොවි පළ කොහි ද? කුමක් කරන්නට ද? සනීපය රැක-ගන්නට නම් ගොවි පළට ළං විය යුතු ප්‍රමාණය හිවල් හාමි හොඳ හැටි දනී. දැන් ඇවිදින්නේ ගොවි පළට වදින්නට සුදුසු වේලාව බලමින් නො වේ, ගොවි හාමි කැලෑ පාරෙන් එයි දැ යි බලමිනුයි. හෝරාවක් ගියේ ය, දෙකක් ගියේ ය, තුනක් ගියේ ය. එහෙත් ගොවි හාමි නො එයි. හිවල් හාමි ගේ ඉවැසිලි දැන් කෙළවර ය. මේ ව්‍යාපාරය හරි නොයන ලෙස ය, දැන් පෙනෙනුයේ. එ හෙයින් හිවල් හාමි දිග සුසුමක් හෙළා පසුවට මඳ ඉවසිල්ලක් දෙන්නට උත්සාහ කොට, කරට උඩින් ගොවි පළ දෙස බලා, පෙර දැක පුරුදු ළා එළු පැටවුන් ගේ මසෙහි ඇති විය යුතු මෙළෙක් බව ගැන සලකා, මඳ තුන් විටක් ම තලු ගසා, ගෙදර යන සිත ඇති කළේ ය. බිම ඇන-ගෙන සිටි පසු භාගය මහත් උත්සහායෙන් සෙමෙන් සෙමෙන් එසැවී ය. හිස මඳක් සලා යළි දු ගොවි පළ දිසාවට ඇස් හැරැවී ය. ඉක්බිති සැබැවින් ම එක් සිත් සිතා-ගෙන වම් ඉදිරි පය පෙරට තිබී ය.

'තඩ්' යන මහ හඬෙක් වනය මැදින් නැඟුණේ ය. හිවල් හාමි සතර පයින් ම රියනක් පමණ අහසට ගියේ ය. බිමට බට කල ඔහු ගේ දෙ කොන මාරු විය. හේ වෙන කිසිවක් නො සලකා ම, හිස් කොන හැරුණු අතට දුවන්නට ඉගිළුණේ ය. එහෙත් තමා කරන්නට පැමිණි ව්‍යාපාරය? එය හරි ගිය හොත් ලැබෙන එළු පැටවු? උන් ගේ මසේ මෙළෙක? අර ඇසුණු බිය කරු හඬ නිසා දෝ මේ සියල්ල බලාත්කාරයෙන් මෙන් හිවල් හාමි ගේ සිතට පෙරළී ආයේ ය. එ හෙයින් ගොවි පළ කවර දිශායෙහි දැ යි සොයන්නට හිස හැරැවූ ඔහුට බඩ අල්ලා-ගෙන හඬ නො නගා සිනා සෙන ගොවි හාමි පෙනුණේ ය.

*- හීන් සැරය*

(අ) 'ගොවි පළේ මායිමට ළං වීම ද සනීපයට හොඳ නො වේ' යන්නෙහි අදහස කුමක් ද?

(ආ) 'මේ ව්‍යාපාරය හරි නොයන ලෙස ය, දැන් පෙනෙනුයේ.' යන වාක්‍ය ඛණ්ඩයේ අදහස ලියා දක්වන්න.

(ඇ) 'ගෙදර යන සිත ඇති කළේ ය' යන වාක්‍යයේ අදහස වෙනස් නොවන පරිදි වෙනත් ආකාරයකට ලියා දක්වන්න.

(ඈ) 'හිවල් හාමි සතර පයින් ම රියනක් පමණ අහසට ගියේ ය.' යන වාක්‍යයේ අදහස ඔබේ වචනයෙන් ලියා එම අවස්ථාව සිතුවමට නගන්න.

(ඉ) ගොවි හාමි බඩ අල්ලා-ගෙන හඬ නො නගා සිනා සෙනු දුටු හිවල් හාමිට ඇති වූ සිතිවිල්ල කුමක් ද යන පැනයට කුමාරතුංග මුනිදාස සූරීන් විසින් රචනා කරන ලද 'හීන් සැරය' නමැති කෘතියේ 10 වන පරිච්ඡේදයේ පස් වැනි ඡේදය කියවා පිළිතුරු සොයන්න.

5

# විවිධාර්ථවත් පද

වෙනත් භාෂාවල මෙන් ම සිංහල භාෂාවේ ද භාවිත වන වචනවල අදහස වටහා ගත යුතු වන්නේ බොහෝවිට එම වචන යෙදෙන පරිසරය අනුව ය. එක ම වචනයකට විවිධ තේරුම් මෙන් ම එක ම තේරුම තිබෙන වචන කිහිපයක් ම යෙදෙන අවස්ථා ද සිංහල භාෂාවෙහි තිබේ. යම් වචනයක් සමග යෙදෙන පරිසරය නැතහොත් එම වචනය සමග යෙදෙන අනෙකුත් වචනවල ද අදහස අනුව අපට අවශ්‍ය වචනයෙහි අදහස වටහා ගත යුතු ය.

## 1 සමානාර්ථ පද

එක ම තේරුමකින්, අදහසකින් යෙදෙන වචන යි.

'සමානාර්ථ පද ඉගෙන ගත යුතු ඇයි ?' යන පැනයට පිළිතුරු සෙවීමේ අදහසින් පහත වැකිය දෙස අවධානය යොමු කරන්න.

"ක්‍රිස්තු වර්ෂ 2012ක් වූ පෙබරවාරි මස 14 වැනි බුද දින එනම් බදාදා දින ඉර උදාව සිදු වන්නේ පූර්වභාග 6. 06ට වන අතර ඉර බැසීම සිදු වන්නේ අපරභාග 6.13ට ය....."

ජ්‍යොතිෂවේදියකු විසින් දිනයේ එලාඵල ප්‍රකාශ කිරීම ආරම්භ කරමින් ඉහත වැකිය පවසන ලදි. එම වැකියෙහි ම ඉර යන පදයට ම සමානාර්ථයක් දෙන පදයක් වූ 'දිනමිණ' යන වචනය යොදා කියවා බලන්න.

එවිට "ක්‍රිස්තු වර්ෂ 2012ක් වූ පෙබරවාරි මස 14 වැනි බුධ දින එනම් බදාදා දින දිනමිණ උදාව සිදු වන්නේ පූර්වභාග 6. 06ට වන අතර දිනමිණ බැසීම සිදු වන්නේ අපරභාග 6.13ට ය....."

යනුවෙන් කියවේ. සමාන අරුත් ඇති වචන දෙකක් වුවත් යෙදෙන සෑම පරිසරයකට ම එක සේ නොගැළපෙන බව දැන් ඔබට මනා ව වැටහෙනු ඇත. එබැවින් ඒ ඒ තැනට නියමිත සුදුසු ම වචනය භාවිතයට ගැනීමට නම් එම වචනවල අර්ථය පිළිබඳ ව මෙන් ම යෙදෙන පරිසරය පිළිබඳ ව ද වැටහීමක් තිබිය යුතුය. ඔබේ මවුබස වූ සිංහල භාෂාව මෙවැනි සමානාර්ථ යෙදුම් බොහෝවකින් පොහොසත් වී තිබීම ඔබට අභිමානය දනවන කරුණකි. ඒ අභිමානයෙන් යුතු ව සමානාර්ථ පද පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම ඔබේ යුතුකමකි. එමගින් ලිපි ලිවීමට, වාර්තා සැකසීමට, හිටිවන කවි තැනීමට ආදී විවිධ අවස්ථාවන්ට ගැළපෙන වචන තෝරා ගැනීම සඳහා හැකිතාක් සමාන පද ඔබ දැනුම් ගබඩාවේ පුරවාගෙන එදිනෙදා භාවිතයට ගැනීම සිදු කළ යුතු යි. නාම පදවලට මෙන් ම ක්‍රියා පදවලට ද සමානාර්ථ පද තිබෙන බව ද මෙහි දී අමතක නොකළ යුතු ය.

උදාහරණ :


ඉපදුණා = ජනිත වුණා, බිහි වුණා
මැරුණා = මියගියා, පරලොව් ගියා, කාලක්‍රියා කළා

## 2 විරුද්ධාර්ථ පද

නාම පද, ක්‍රියා පද ආදි වශයෙන් වූ යම් පදයකට විරුද්ධ අදහසක් ගෙන දෙන පද විරුද්ධාර්ථ පද නම් වේ.

ඉහත සමානාර්ථ යෙදුම් පිළිබඳ කරන ලද පැහැදිලිකිරීම් අනුව සිංහල භාෂාවේ මෙවැනි විරුද්ධාර්ථ වචන ද බෙහෙවින් ඇත. ඒ වචන දැනගෙන ඔබේ වාක් කෝෂය පුළුල් කර ගැනීම මගින් නොපැකිල කථා කිරීමටත්, ලිවීමේ දී රසවත් ව නිරවුල් ව අදහස් ප්‍රකාශ කිරීමටත් හැකි වේ.

පිං - පව්
ඉපදෙන - මැරෙන
පිරිසිදු - අපිරිසිදු
අහස - පොළොව
අව්ව - වැස්ස
රැය - දහවල



3 බහ්වර්ථ පද

'බහු' යනු 'බොහෝ ', 'සමූහයක් ' යන තේරුමක් ගෙන දෙන්නකි. 'අර්ථ' යනු 'තේරුම්' ය. ඒ අනුව 'බහු අර්ථ' හෙවත් 'බහ්වර්ථ' යනු 'බොහෝ තේරුම්' ය. බොහෝ අර්ථ සඳහා එක ම පදය නැතහොත් වචනය යෙදෙන පද බහ්වර්ථ පද වේ.

'සොරු දන පැහැර යෙත්
සුදන දන මන පැහැර යෙත් '

මෙහි මුල් පේළියේ දන යනු ධනය හෙවත් වස්තුව යන අර්ථයෙන් යෙදුණු පදයකි. එම පදය ම දෙවැනි පේළියෙහි යෙදී ඇත්තේ ජනතාව යන අදහසිනි. මේ ආකාරයට එක ම පදයක්, අකුරුවල ද වෙනසක් නොමැති ව යෙදෙන පරිසරය අනුව බොහෝ අරුත් නියෝජනය කරන අවස්ථා ඇති බව පෙනී යයි. එවැනි බොහෝ තේරුම් ඇති බහ්වර්ථ පද රැසක් සිංහල භාෂාවේ දක්නට ඇත.

# කුසලතා වර්ධනයට:

1. පහත සඳහන් පදවලට සමාන පද අවම වශයෙන් එකක් බැගින් හෝ ලියා දක්වන්න.

| | |
|---|---|
| මව | පිපෙනවා |
| පියා | සෙලවෙනවා |
| ඉර | බොනවා |
| හඳ | නැටුම |
| ගස් | භාවනාව |
| පොත් | නිවන |

2. i පහත සඳහන් වැකිවල ඉරි ඇඳි පදවලට විරුද්ධාර්ථ දෙන පද හිස්තැන්වල ලියන්න.
   ii එම වැකිවල ම වර්ණ ගැන්වූ වදන්වලට විරුද්ධාර්ථ දෙන පද වරහන් තුළ ලියන්න.

- මත්ද්‍රව්‍ය භාවිතයෙන් සතුටක් ලැබෙන්නේ යැයි අඥාන මිනිසුන් සිතුව ද සැබවින් ම ලැබෙන්නේ .................... කි. (        )
- භික්ෂූන් වහන්සේගේ සිවුර සරල බවේ ප්‍රධාන ම සංකේතයක් වන නමුත් බැයූ බැල්මට ඉන් පෙනෙන්නෙ .................... මැහුම් රටාවකි. (        )
- සිංහල සාහිත්‍යය සතු ව පැරණි සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයක් හා .................... සාහිත්‍යාංග තිබේ. (        )
- හිරු බැස යත් ම අහසේ නැගී .................... සිය සෞම්‍ය රැස් දහරින් ගං දිය නැහැවී. (        )

3. i පහත සඳහන් විවිධ අර්ථ ගෙන දෙන වදන් හෙවත් බහ්වර්ථ පද සහිත වැකිවල දැක්වෙන ඉරි ඇඳි බහ්වර්ථ පදයේ අර්ථය, එම පදය යෙදී ඇති වාක්‍යයේ අදහසට අනුව වරහන් තුළ ලියා දක්වන්න.

උදාහරණ : දිය

- දිය ගොඩ සැම තැන කිරි ඉතිරේ. (ජලය)
- ඡන්දදායකයා සිය ඉල්ලීම ඉටු කර දිය හැකි දැයි මන්ත්‍රීවරයාගෙන් සෘජු ව ම ප්‍රශ්න කළේ ය. (දීම)
- දිය දම් නිති කැරපෙත්. (ලෝක)

පා

- හැකරැල්ලා බහුපා සත්ත්වයකු වන අතර හරකුක්කා පා නොමැති උරග වර්ගයට අයත් සතෙකි. (...................)
- කූඨ ව්‍යාපාරිකයෝ සිනහ මුහුණක් පා පාරිභෝගිකයන් නොමග යවති. (...................)
- සිදුහත් තවුසා සිය පාත්‍රය උඩු ගං බලා පා කර හැරියේ ය. (...................)

දද

- 64 වෙනි නිදහස් උළෙල දා සිරිලක් අහස් කුස සිසාරා නැගී සිහ දද එක්සේසත් රටක මහිමය ලොවට පෙන්වී ය. (...................)
- සිරුරෙහි හට ගන්නා දදු නිසා රෝගීහු කායික වේදනාවක් මෙන් ම දැඩි මානසික පීඩාවක් ද විඳිති. (...................)
- නිවට දද පුරුෂයන් දෙස ප්‍රඥාවන්තයෝ සැම විට ම දයා සහිත දෘෂ්ටියකින් බලති (...................)

සඳ

- කන්ද කපා පායන් රන් පුන් **සඳ**. (...................)
- සකි **සඳ** පෙණේ සමතොල ගල නැගෙනහිර. (...................)
- දෙව්රම් වෙහෙරෙහි බුදු හිමි වැඩ හිඳි **සඳ** බොහෝ දන පින් රැස් කර ගත්හ. (...................)

4. පහත සඳහන් කාව්‍ය නිර්මාණය කියවා රස විඳ අසා ඇති ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න

## මගේ රට

පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය
පණ ඇති මහා සමුද්‍ර පවුරෙන් වටය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණා රටය
ලොව අන් සියලු දිවයින් මේකට යටය

මහවැලි-කැලණි-වලවේ-කළු යන ගංගා
සමනල කන්ද මුදුනෙන් සිට පැන බැංගා
බැවුම් තැනිතලා හෙල් අතරින් පීංගා
මෙවා ගලයි මිණි කැට දිය යට හංගා

. . .

-ජී. බී. අල්විස් පෙරේරා

(අ) ''පෙරදිග ලෝකයේ බබළන මුතු ඇටය'' යනුවෙන් මෙහි හැඳින්වෙන්නේ කුමක් ද?

(ආ) පණ ඇති සේ සලකා ඇත්තේ කුමකට ද?

(ඇ) මා ඉපදුණු රට වශයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(ඈ) 'කිසි දු රටකට හෙළ දිවයින නොදෙවෙනි ය' යන අදහස කියවෙන කවි පද පේළිය ලියා දක්වන්න.

(ඉ) මෙහි කියවෙන ගංගා හතරේ නම් මොනවා ද?

(ඊ) මෙය සරල වචන යොදා ගනිමින් ලියූ ඉතා අරුත්බර ගීයකි. ඔබත් ඔබේ රට ගැන මෙවැනි රසවත් කවි නිර්මාණ කරන්න.

(උ) මගේ රට කවි පන්තියේ ඉතිරි කවි කිහිපයන් සොයා, කියවන්න. ගුරුවරයාගේ උපකාරයෙන් අරුත් පැහැදිලි කර ගන්න.

6

# වාක්‍ය රචනය

නාම පද, අවසාන ක්‍රියා පද ආදි වශයෙන් විවිධ පද පිළිබඳ ඉගෙන ගත් ඔබ ඒවා භාවිත කර සරල වාක්‍ය තැනීමේ හැකියාව ලබා ගත්තෙහි ය. දැන් ඒ සරල වැකි එකතු කර, යම් පිළිවෙලකට ගළපා ලිවීමට පුහුණුවක් ලබා ගැනීමෙන් වාක්‍ය රචනාවක් ලියන්නේ කෙසේ ද, කියා ප්‍රමාණවත් අවබෝධයක් ඔබට ලද හැකි ය.

"ළා දලු බෝපත් සෙමෙන් සැලේ " ආදි වශයෙන් යම් පිළිවෙළකට පද ගැළපුවා සේ වාක්‍ය පෙළගැස්මෙහි ද පිළිවෙළක් තිබිය යුතු ය.

පහත සඳහන් රූපය දෙස හොඳින් බලන්න.



ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ පිළිබිඹු කෙරෙන මේ ඡායාරූපය පිළිබඳ අපට පහත සඳහන් වාක්‍ය නිර්මාණය කළ හැකි ය.

1. ලෝකවාසී බෞද්ධ ජනතාවගේ ම ඉමහත් ගරු බුහුමනට පත් ජය ශ්‍රී මහා බෝධිය ජාතික වස්තුවක් සේ සලකා සුරැකිය යුතු ය.

2. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය ලැබීමට පෙර මෙම වෘක්ෂයේ නාමය, 'ඇසතු' ය.

3. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය එම වෘක්ෂයට ලැබුණේ, අප ගෞතම බුදුරදුන් විසින් තමන් වහන්සේට බුදු වීම සඳහා සෙවණ ලබා දීම වෙනුවෙන් අනිමිස ලෝචන පූජාවෙන් මෙම වෘක්ෂය පුදනු ලැබීමෙන් අනතුරු ව ය.

4. ජය ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ, සංඝමිත් තෙරණිය විසිනි.

5. ඉන්දියාවේ පිහිටි ශ්‍රී මහා බෝධිය වර්තමානය වන විට අභාවයට ගොස් ඇති බැවින් එම මුල් බෝධියේ ම දක්ෂිණ ශාඛාවක් වූ අපේ ජය ශ්‍රී මහා බෝධිය ලෝක බෞද්ධ ප්‍රජාවගේ ම අමිල වස්තුවක් බවට පත් වී ඇත.

6. ජය ශ්‍රී මහා බෝධිය ලොව පැරණි ම ඉතිහාසයක් ඇති වෘක්ෂය වශයෙන් ගෞරව බහුමානයට පාත්‍ර වේ.

7. බෞද්ධයන්ගේ මුදුන්මල්කඩක් බඳු ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඩ හිඳින්නේ අනුරාධපුර මහමෙව්නා උයනේ ය.

වෙන වෙන ම කරුණු වශයෙන් දැක්වෙන මෙම වාක්‍ය කිහිපය, එකට කැටි කොට ඡේදයක් වශයෙන් ලියූ විට එය කුඩා වාක්‍ය රචනයක් බවට පත් කර ගත හැකි වෙයි. එහි දී හුදකලා වාක්‍ය මෙන් නොව වාක්‍ය ලිවීමේ පිළිවෙළක් තිබිය යුතු ය. මුලින් ම ලිවිය යුත්තේ කුමන වාක්‍යය ද කියා තෝරා බේරා ගත යුතු ය. ආසන්න වාක්‍ය දෙකක යෙදෙන එක ම වචනය වෙනුවට දෙවෙනි වාක්‍යයේ දී සර්ව නාම (මින් පෙර පාඩමක දී ඔබ උගත්) යෙදිය හැකි ය. එවිට අනවශ්‍ය පුනරුච්චාරණයක් සිදු නොවන අතර ම සංක්ෂිප්තභාවයක් ද ලැබේ. ඉන් වාක්‍ය රචනයට මනා පෙළගැස්මක් ද ලැබේ. මේ කරුණු පිළිබඳ අවධානයෙන් පහත වාක්‍ය රචනය දෙස නෙත් සිත් යොමු කරන්න.

## ජය ශ්‍රී මහා බෝධිය

ජය ශ්‍රී මහා බෝධිය ලොව පැරණි ම ඉතිහාසයක් ඇති වෘක්ෂය වශයෙන් ගෞරව බහුමානයට පාත්‍ර වේ. ඉන්දියාවේ පිහිටි ශ්‍රී මහා බෝධිය වර්තමානය වන විට අභාවයට ගොස් ඇති බැවින් එම මුල් බෝධියේ ම දක්ෂිණ ශාඛාවක් වූ අපේ ජය ශ්‍රී මහා බෝධිය ලෝක බෞද්ධ ප්‍රජාවගේ ම අමිල වස්තුවක් බවට පත් වී ඇත.
ජය ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරවන ලද්දේ, සංඝමිත්තා තෙරණිය විසිනි.

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ යන ගරු නාමය එම වෘක්ෂයට ලැබුණේ, අප ගෞතම බුදුරදුන් විසින් තමන් වහන්සේට බුදු වීම සඳහා සෙවණ ලබා දීම වෙනුවෙන් අනිමිස ලෝචන පූජාවෙන් මෙම වෘක්ෂය පුදනු ලැබීමෙන් අනතුරු ව ය. එම ගරු නාමය ලැබීමට පෙර මේ වෘක්ෂයේ නාමය, 'ඇසතු' ය.

බෞද්ධයන්ගේ මුදුන්මල්කඩක් බඳු මෙම ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ වැඩ හිඳින්නේ අනුරාධපුර මහමෙව්නා උයනේ ය. ලෝකවාසී බෞද්ධ ජනතාවගේ ම ඉමහත් ගරු බුහුමනට පත් ජය ශ්‍රී මහා බෝධිය ජාතික වස්තුවක් සේ සලකා සුරැකිය යුතු ය.

මේ වන විට ඔබට රචනාවක් ලිවීම පිළිබඳ මූලික අවබෝධයක් ලැබෙන්නට ඇති. ඒ අවබෝධය තවත් වැඩි දියුණු කර ගත හැකි කරුණු කිහිපයක් පහතින් දක්වා ඇත.

- මාතෘකාවට අදාළ කරුණු පැවසීම
- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව පැහැදිලි අත් අකුරින් ලිවීම
- උක්ත ආඛ්‍යාත ගැළපීම
- සිත්ගන්නාසුලු අයුරින් ලියා දැක්වීම
- රසවත් නිවැරදි බස් වහරක් යොදා ගැනීම
- හැකි සෑම අවස්ථාවක ම කෙටි සරල වැකි යොදා ගැනීම
- කරුණුවල වැදගත්කම අනුව මුල, මැද, අග ඡේද මනා සේ ගැළපීම වැනි කරුණු කෙරෙහි තිසි අවධානය යොමු කිරීම

ඉහත කරුණු පිළිබඳ අවබෝධයකින් යුතු ව යම් මාතෘකාවක් යටතේ රචනයක් ලිවීමට ආරම්භ කිරීමට පෙර මූලික ව ම සැකිල්ලක් සාදා ගත යුතු ය. උදාහරණයක් ලෙස 'මා ගිය අධ්‍යාපන චාරිකාවක්' යන මාතෘකාව යටතේ රචනයක් ලිවීමට අවශ්‍ය වුව හොත් මූලික ව ම පහත පරිදි සැකිල්ලක් සාදා ගත හැකි ය.

- චාරිකාව සඳහා මූලික ව කරනු ලබන සංවිධාන කටයුතු හෙවත් සූදානම
- නැරඹූ ස්ථාන
- එම ස්ථානවල ඓතිහාසික හෝ වෙනත් වටිනාකම්
- නැරඹූ ස්ථාන හා ලැබූ අද්දැකීම්
- සමස්ත චාරිකාවේ වැදගත්කම

මේ එක් එක් කරුණ යටතේ එක් එක් ඡේදය ලිවීමට පුළුවන.

# කුසලතා වර්ධනයට:

1. පහත රූපසටහන දෙස හොඳින් බලන්න.




(අ) මෙම රූපසටහනින් දැක්වෙන්නේ කුමක් ද?

(ආ) රූපසටහනින් දැක්වෙන දේ පිළිබඳ වාක්‍ය රචනයක් ලිවීම සඳහා සුදුසු මාතෘකාවක් යොදන්න.

(ඇ) රචනාව සඳහා සුදුසු සැකිල්ලක් සකස් කරන්න.

(ඈ) එම සැකිල්ලට අනුව වෙන වෙන ම ඡේද වශයෙන් රචනාව ලියන්න.

1. පහත දී ඇති රුකුල් පද ආධාරයෙන් මේ ප්‍රහේලිකාව පුරවන්න.




හරහට

2. බැංකු ණයක් ගැනීමේ දී බොහෝ විට මේවා තැබීමට සිදු වේ.
5. ගීතයට සමාන වචනයකි.
6. වඩාත් හොඳින් පෙනෙන්නට තිබෙන යන අර්ථයෙන් යෙදේ.
7. පෝය දිනවල ගිහියෝ ද මේ සිල් සමාදන් වෙති.
8. පසළොස්වක පෝය දාට චන්ද්‍රයාගේ මේවා පහළොවක් තිබේ යැයි කියති.
9. නියෝග යන්නට සමාන පදයකි.
11. ගිහියන් නොකර සිටිය යුත්තේ,

පහළට

1. චතුරාර්ය සත්‍යයේ පළමු වැන්නයි.
2. ශ්‍රව්‍ය-දෘශ්‍ය යන්නට සමාන පදයකි.
3. ගිහි බෞද්ධයාගේ නිත්‍ය ශීලය මෙය යි.
4. බෞද්ධයාගේ ආගමික පරමාර්ථය මෙයයි.
6. මෙවැනි පුද්ගලයෝ වර්තමාන සමාජයේ බහුල ව සිටිති.
7. දිගු කලක් භාවිත කළ කල සිවුරු මේ පැහැයට හැරේ.
9 මෙය ඇති විට ඇඳුම් වියළා ගැනීම පහසු ය.
10. මූර්ධජ 'ණ' යන්නෙන් ඇරඹෙන සිංහල භාෂාවේ එක ම වචනය මෙය යි.

1. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පළ කර ඇති 'රකිමු අපි පරිසරය' නමැති පරිසර නියමු උපදෙස් පොතේ පහත සඳහන් ගීතය ඇතුළත් වේ. එය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## පරිසර ගීතය

දෙව් ලොව ද මවු බිමට දෙවැනි කොට සිතන්නෙමු
දෙව් ලොවේ නැති අසිරි මවු බිමේ දකින්නෙමු
පරිසරය රකින්නෙමු, වඩන්නෙමු, වවන්නෙමු
මේ පිළිනයෙන් සදා මවු බිමට බැඳෙන්නෙමු

වලා සිඹ ගලා යන නදී දිය නිරතුරු ය
වන උයන් මල් උයන් පල උයන් විසිතුරු ය
සිසිලසින් පණ පොවන මඳ පවන පිවිතුරු ය
පරිසරය රැකෙන තුරු සොබා දම සුමිතුරු ය

තණ්හාව ආසාව ඇයි ද පොදි බඳින්නේ
[illegible] වන සම්පතට ඇයි පොරොව නගන්නේ
සොබා දම කිපුණු දා සත් මග මැ ගසින්නේ
පරිසරය රකින්නේ මුළු රට මැ රකින්නේ

මේ මිහි මත වසන සත සිතෙහි මෙත වැඩේ වා
ගහ කොළට පවා එම මෙත් සිසිල දැනේ වා
බව බෝග සම්පතින් සතට සෙත සැදේ වා
අපේ හුස්මෙන් පවා පරිසරය නිවේ වා

පදමාලාව - අරිසෙන් අහුබුදු

i (අ) මවු බිමට දෙවැනි කොට සිතිය යුත්තේ කුමන ලොව ද?

(ආ) නිරතුරු ව ගලා යන නදී දිය සිඹින්නේ කුමක් ද?

(ඇ) සොබා දම සුමිතුරු වන්නේ කුමක් රැකෙන තුරු ද?

(ඈ) තණ්හා ආසා පොදි බැඳ පොරව නගන්නේ කුමකට ද?

(ඉ) මිහි මත වසන සත්ත්වයන්ගේ සිතෙහි වැඩිය යුත්තේ කුමක් ද?

(ඊ) ගහ-කොළට පවා දැනිය යුත්තේ කුමක් ද?

(උ) අපේ හුස්මෙන් පවා සිදු විය යුත්තේ කුමක් ද?


ii (අ) පහත යෙදුම්වලට සුදුසු සමාන පද ගීතයෙන් තෝරා ලියන්න.

- මාතෘ භූමිය
- ආශ්චර්ය
- ගංගා
- ජලය
- උද්‍යාන
- සුළඟ
- පවිත්‍ර
- තෘෂ්ණාව
- කෝපාවිෂ්ට
- යහපත
- මෛත්‍රිය
- ප්‍රතිඥාවෙන්
- සැමදා
- නිරන්තර
- විචිත්‍ර
- පවිත්‍ර
- වාසය කරන

(අ) ගීතයේ සඳහන් උත්තම පුරුෂ බහු වචන අවසාන ක්‍රියා පද පහක් ලියන්න.

(ආ) එම ක්‍රියාපද ඒක වචනයට හරවා ලියන්න.

(ඇ) දන්තජ 'ල' සහ දන්තජ 'න' අකුරු යෙදී ඇති වචන පහ බැගින් ගීතය තුළින් තෝරන්න. පහත දැක්වෙන සමනලයාගේ රූපය බඳු රූපයක් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න. ඇඳ, එම වචන සමනල තටු දෙකෙහි ලියා දක්වන්න.



iii (අ) රමණීයානි අරඤ්ඤානි ... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර අදහස ලියා දක්වන්න.

(ආ) පහත දැක්වෙන්නේ බුදුරදුන් හා ස්වාභාවික පරිසරය සම්බන්ධ වාක්‍ය කිහිපයකි. දී ඇති වචන අතුරින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.

1). බුදුරදුන් බෙහෙවින් ප්‍රිය කළේ ........................... (ස්වාභාවික වන සෞන්දර්ය, නැටුම් සන්දර්ශන) නැරඹීමට ය.

2). වෙසක් පොහෝ දිනක සිදුහත් කුමරු මවු කුසින් බිහි වූයේ ද ........................... (පොල්, සල්) ගසක් යට දී ය.

3). ගෞතම බුදුරදුන් සම්බුද්ධත්වයට පත් වූයේ ද ........................... (බෝ ගසක්, කොහොඹ ගසක්) සෙවණේ දී ය.

4). බුදුහිමියන්ගේ මුල් ම ආදර්ශය වූ කළගුණ සැලකීමේ ගුණය ප්‍රකට කළේ ද තමාට බුදු වීමට සෙවණ දුන් ........................... (ඇසතු, පරසතු) වෘක්ෂය දෙස ඇසිපිය නොහෙළා පුරා සතියක් එක දිගට බලා හිඳීමෙන් කරන ලද අනිමිස ලෝචන පූජාවෙනි.

iv (අ) 'රකිමු පරිසරය' මැයෙන් රචනාවක් ලියන්න.

7

# විරාම ලක්ෂණ

කතාබහ කිරීමේ දී වචන හෝ වාක්‍ය නැවැත්විය යුතු තැන නවත්වා, හඬ උස් පහත් කර, කියවන වේගය අඩු වැඩි කර කියවීමෙන් කියවන්නාගේ අදහස් අන් අයට වඩාත් හොඳින් වටහා දීමට පිළිවන. අංග චලන, මුහුණේ ඉරියව් ආදිය ද උපකාර කර ගෙන එය තවත් හොඳින් කළ හැකිය. එහෙත් ලේඛනයේ දී ඒ සියල්ල වෙනුවට යොදා ගනු ලබන්නේ විරාම ලක්ෂණ නමැති සලකුණු විශේෂයකි.

නැවතීමේ තිත, කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණු, විස්මයාර්ථ ලකුණ ආදි සලකුණු, විරාම ලක්ෂණ වශයෙන් යෙදේ. මේ පාඩමේ දී අවධානය යොමු කරනු ලබන්නේ පහත සඳහන් විරාම ලක්ෂණ තුන කෙරෙහි පමණි.

- ♦ තිත ( . )
- ♦ ප්‍රශ්නාර්ථ ලකුණ ( ? )
- ♦ විස්මයාර්ථ ලකුණ ( ! )

විරාම යන වචනයෙහි මූලික අදහසක් වන්නේ නැවතීම යන්න යි. ඉහත විරාම ලක්ෂණ යොදා ඇති තැන්වල දී යම් නැවතීමක් සහිත ව වාක්‍ය කියවීමෙන් අදහස වඩාත් හොඳින් වටහා ගත හැකි වෙයි.

## තිත .

විරාම ලක්ෂණයක් වශයෙන් තිත යෙදෙන ප්‍රධාන අවස්ථා දෙකක් කෙරෙහි අවධානය යොමු කරමු.

1 වාක්‍ය අවසානයේ යෙදෙන නැවතීමේ තිත

උදාහරණ - රාහුල හිමියෝ දත් වළඳති.

2 වචනයක් හෝ වචන කෙටි කර දැක්වීමේ දී හෙවත් කෙටි යෙදුම් සඳහා තිත යෙදේ.

උදාහරණ - විමල හිමියෝ දිනපතා අවදි වන්නේ පෙ. ව. හතරට ය.
මෙහි පෙ. ව. යනුවෙන් යෙදුණේ 'පෙරවරු' යන වචනය කෙටි කර දැක්වීමට යි.
- අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය සාමාන්‍යයෙන් පැවැත්වෙන්නේ දෙසැම්බර් මාසයේ දී ය.
මෙහි අ. පො. ස. යනුවෙන් යෙදුණේ 'අධ්‍යයන', 'පොදු', 'සහතිකපත්‍ර' යන වචන කෙටි කර දැක්වීමට ය.

** තිත යොදා වචන කෙටි කර දැක්වීමේ දී දීර්ඝ කාලයක් ගත වී බොහෝ දෙනා දන්නා හුරු පුරුදු වචන බවට පත් වූ පසු සමහර වචන කෙටි කිරීමට යොදා ගත් තිත ඉවත් වී නාම පද වශයෙන් භාවිත වනු දැකිය හැකි ය.*

උදාහරණ - ලංකා ගමනාගමන මණ්ඩලය > ල. ග. ග. ම. > ලංගම
- සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව > ස. තො. ස. > සතොස

කෙටියෙන් දැක්විය යුතු වචන කිහිපයක් තිබෙන විට මුල් ම වචනයේ මුල් අකුර සමග 'ං' යෙදුණහොත් උච්චාරණයේ පහසුව සඳහා එම බින්දුව හෙවත් අනුස්වාරය ද සමග කෙටි යෙදුම භාවිත කරයි. එහෙත් කෙටි කරන වචන කිහිපයේ අන්තිම වචනයේ මුලකුර සමග අගට යෙදෙන 'ං' අත්හැරී. දක්වා ඇති උදාහරණ වැකි මැනවින් පිරික්සා බලන්න.

## ප්‍රශ්නාර්ථ ලකුණ ?

ප්‍රශ්නයක් විමසන වාක්‍යයක අවසානයේ යෙදේ.

උදාහරණ - මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබේ ද?
- මේ අඹ ගස හැර වෙනත් අඹ ගස් තිබේ ද?
- ශ්‍රී ලංකාවේ දිග ම ගඟ කුමක් ද?

ඉහත උදාහරණවල මෙන් ප්‍රශ්නයක් විමසන බොහෝ වාක්‍ය අවසානයේ 'ද' අකුර යෙදී තිබෙනු දැකිය හැකි යි. එහෙත් ඊට වෙනස් පහත උදාහරණ බඳු අවස්ථා ද පවතී.
- බොහෝ පැණි දොඩම් තිබේ ද, මේ ගසේ?
- තිබේ ද, බොහෝ පැණි දොඩම් මේ ගසේ?

යම් අවිනිශ්චිත හෝ සැකයක් සහිත වාක්‍යයක් ලිවීමේ දී ද ප්‍රශ්නාර්ථ සලකුණ යෙදේ.

උදාහරණ - ඇය දිනුවා?
- තවත් සුනාමියක්?

# විස්මයාර්ථ ලකුණ !

මෙම විරාම ලක්ෂණය, 'හර්ෂාදි ලකුණ', 'ආශිර්වාද ලකුණ' යන නම්වලින් ද හැඳින්වේ. එය විස්මය, සතුට, දුක, පිළිකුල වැනි හැඟීම් දැනවීමට මෙන් ම ආමන්ත්‍රණයක්, ආශිර්වාදයක් පළ කිරීමටත් ලේඛනයේ දී යෙදේ. වාක්‍යයක හෝ වාක්‍ය ඛණ්ඩයක අග මෙන් ම වෙනත් ස්ථානවලත් යෙදේ.

උදාහරණ - ඔහුට ලොතරැයිය ඇදුණා!
- අහා! ප්‍රීතියි.
- අහෝ ඛේදයකි!
- චී! චී! ගෙරි මස් නොකනු.
- රාජ පුරුෂය! වහා එහි යව.
- සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා!

# කුසලතා වර්ධනයට:

1 සුදුසු විරාම ලක්ෂණ යොදා පහත වාක්‍ය සම්පූර්ණ කරන්න.

i මම නිදුක් වෙම්වා
ii රාංචල හිමියෝ දහට වැඩම කළෝ ය
iii දායිකාව ගිලන්පස පිළිගැන්වූවා ද
iv අනේ දෙවිදත් නොදිටි මොක් පුර
v ඔහු ද මේ භයානක සොරා
vi ඇතා නගුලක් වාගේ යැයි එක් අන්ධයෙක් කී ය
vii එම්බල දුෂ්ටය නුඹ මේ අහිංසක සතා මැරුවේ කුමන සිතකින් ද
viii සුබ නව වසරක් වේවා
xi සතියකට දින කීයක් තිබේ ද
x අමහෝ සිදු වූ විපතක මහත

2 සුදුසු විරාම ලක්ෂණ යොදා පහත සඳහන් ඡේදය ඔබේ අභ්‍යාස පොතේ ලියන්න.

දුම්කොළ දැවෙන විට පිට වන දුමාරය කැටි ගැසීමෙන් ජනිත වන ලාටු වර්ග දුම්කොළ තාර ලෙස හඳුන්වනු ලබයි මහාමාර්ග තැනීමට භාවිත කරන්නේ තාර බව ප්‍රකට කරුණකි සිගරට්ටුවක් හෝ බීඩියක් ඉරූ විට තාර ශ්වසන පද්ධතියේ පතිත වන්නේ ය ඒ තාර පෙණහලුවල ඇතුළු පැත්තේ සෛල ස්තරය උත්කෝපනය කරයි (හානි කරයි) එය පිළිකාකාරකයකි.

3 වැරදි ලෙස යෙදී ඇති විරාම ලක්ෂණ සුදුසු පරිදි ස්ථානගත කරන්න.

i නා මල සුවඳැති මලකි!
ii පුඤ්ඤානන්ද හිමියෝ මහා හිස්මීමක් ඇති හිමිනමක් වූහ?
iii මැණියෝ නිරෝගී වෙත්වා.
iv පියාණෝ නිදුක් වෙත්වා?
v ජනනි කුඩා දැරියකි!
vi අහෝ , නුඹට කුමක් සිදු වී ද!
vii ගොවිතැන ධාර්මික ජීවනෝපායකි?
viii කලට වැසි වසීවා?
xi අහා? බුදු ගුණ මහිමය ආශ්චර්යයකි?
x ලෝකයට සාමය උදා වේවා.

# 8

# ප්‍රායෝගික ලේඛන

එදිනෙදා ජීවිතයේ දී විවිධ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියනු ලබන විවිධ ලිපි ලේඛන, ප්‍රායෝගික ලේඛන යනුවෙන් අදහස් වේ. පෞද්ගලික ලිපි, රාජකාරී ලිපි, වාර්තා, ආරාධනා පත්‍ර යනාදිය එවැනි ලේඛන ය. මෙහි දී මූලික ව ම අවධානය යොමු කරන්නේ පෞද්ගලික ලිපියක් හා වාර්තාවක් ලියන ආකාරය පිළිබඳ ව යි.

## පෞද්ගලික ලිපි

පහත දැක්වෙන්නේ පෞද්ගලික ලිපියකට නිදසුනකි.

2012. 04. 09
නිවසේ දී ය.

සෙත් වේවා !

හිතවත් කුමාර,

අප මුණගැසී සතියක් යාමටත් පෙර ලිපියක් එවීමට සිතුවේ මා දැනගත් ඉතා වැදගත් තොරතුරක් ඔබට පවසන තෙක් මා තුළ ඇති වූ නොඉවසිල්ල නිසයි. මා මෙන් ම ඔබත් අපේ කමට, අපේ දේවල්වලට, අපේ රටට දක්වන ඇල්ම නිසා මේ තොරතුර ඉතා ඉක්මනින් ඔබත් සමග බෙදා ගන්න මා ඉක්මන් වුණා.

මේ සිංහල අවුරුදු කාලයේ නෑගම් යනවිට නෑගි බෝග අරං යන්න අප අමතක කරන්නෙ නැහැනෙ. ඒත් 'කේක්', 'බිස්කට්' වගේ දේවල්නෙ වැඩිපුර ම අරගෙන යන්නෙ. ඒත් කුමාර ඔයා දන්නවද, <u>'නෑගි බෝග'</u> කියන වචනෙ තේරුම මොකක් ද කියලා? ඒ කියන්නේ නෑගී සඳහා භෝග වර්ග ගෙනියනවා කියන එකයි. ඉස්සර අපේ පැරණියන් හාල්, පොල්, පලතුරු, එළවළු, කව් භෝග තමා නෑගී සඳහා රැගෙන යන්නෙ. ඒවා අලුත්. ඒ වගේ ම ඒවායෙහි කෘත්‍රිම රස කාරක, 'ඩයි' වර්ග ආදී විෂ ජාති නැහැ. ඉතිං අපෙන් දුරස් වෙලා, අපට අමතක වෙලා යන මේ වැදගත් පුරුද්ද පිළිබඳ ව මේ අවුරුදු කාලෙදිවත් හිතලා බලන එක, ඒ වගේ ම අනිත් අයටත් කියලා දෙන එක හොඳයිනෙ. ඒකයි, මේ ගැන මුලින් ම ඔයාට කිව්වෙ. රූපවාහිනී වැඩසටහනක් බලද්දි තිලක් කන්දේගම කියන පර්යේෂණවේදියෙක් තමයි, මේ අදහස ඉදිරිපත් කළේ.

මේ අදහස මගෙ හිතට කොයිතරම් කා වැදුණාද කියනවා නම් මුලින් ම ඔයාගෙ සැප දුක් වත් අහල ඉන්නත් මට අමතක වුණා. ගෙදර සියලු දෙනා ම ආදරයෙන් මතක් කළ බව කියන ගමන් ම මේ පණිවිඩයත් දෙන්න. ඔයාලගෙ සීයා එහෙම නම් මේ වගේ වචනවල, වාක්‍යවල තියෙන අදහස හොඳින් දන්නවා ඇති නේද? පුළුවන් නම් සීයගෙන් අහල දැනගෙන මට ලියලා එවනවාද, <u>'දුන්න කෙං ගෙඩියක් හද'</u> කියලා කියන පාඨයේ 'කෙං ගෙඩිය' කියන්නෙ මොකකට ද, එහි තියෙන අදහස මොකක්ද කියලා ?

එහෙම නම් කුමාර ඒ පිළිතුර ඉක්මනින් ම ලැබේවි යැයි කියන බලාපොරොත්තුවෙන් මම අදට නවතින්නම්. ඔයා ඇතුළු පවුලේ සියලු ම දෙනාට තෙරුවන් සරණ යි !

මම,
හිතවත් මිතුරා,
රංජි.

ඉහත පෞද්ගලික ලිපිය නිදසුනකට ගෙන එවැනි ලිපියක් ලිවීමේ දී සැලකිල්ලට බඳුන් කළ යුතු කරුණු කවරේ දැයි විමසා බැලීමට පුළුවන.

## පෞද්ගලික ලිපියක ප්‍රධාන කොටස්

| | |
|---|---|
| 1. ලිපි ශීර්ෂය | : සාමාන්‍යයෙන් දකුණු පස ඉහළ කෙළවර ලිපිය ලියන දිනය හා ස්ථානය දැක්වේ. (ලියන්නා සහ ලබන්නා අතර පවතින සමීපත්වය අනුව දිනයට යටින් සම්පූර්ණ ලිපිනය ම නොලියා *'නවාතැනේ දී', නිවසේ දී* යනාදි වශයෙන් මෙන් ම *හුදකලාවේ දී, නිසල මොහොතක* වැනි යෙදුම් ද සඳහන් කර තිබෙනු දක්නට ලැබේ.) |
| 2. ආශිර්වාදය | : ලියන්නාගේ ආගමට අනුකූල සුබපැතුම් වැකියක් මෙහි යෙදිය යුතු ය. (*සැරදේවා!, තිසරණ සරණ වේවා!* ...) |
| 3. ආමන්ත්‍රණය | : ලියන්නා සහ ලබන්නා අතර පවතින සමීප සම්බන්ධය අනුව සුදුසු ඇමතුම් පදයක් යෙදිය යුතු ය. (*ආදරණීය අම්මේ, ප්‍රිය මිතුය, හිතවත් සුමේධ හිමියන් වෙත, දයාබර සිසු දරුව* ...) |
| 4. අන්තර්ගතය පණිවිඩය | : ලිවීමට අදහස් කළ කරුණ හෝ කරුණු පැහැදිලි ව කෙටියෙන් සඳහන් කළ යුතු ය. ඒ කරුණුවලට අදාළ ව සුදුසු පරිදි ඡේද වෙන් කළ යුතු ය. ලිපියේ අන්තර්ගතය නිමා කිරීමේ දීත් සුදුසු ආශිර්වාදයකින් ම අවසන් කළ හැකි ය. (ඔබට ***තෙරුවන් සරණ/ ඉක්මන් සුවය/ දීර්ඝායු*** පතමින් මම නවතිමි... යනාදි වශයෙන්) |
| 5. අවසානය | : ලියන්නා සහ ලබන්නා අතර පවතින සමීප සම්බන්ධය අනුව ම ලිපිය අවසානයේත් සුහදත්වය පළ කෙරෙන පදයක් නම නමට ඉහළින් යෙදිය හැකි ය. (*ආදරණීය, හිතවත්, දයාබර, සුහද* ...වැනි) එසේ ම පෞද්ගලික ලිපිවල දී නම සම්පූර්ණ නම ලිවීමට හෝ අත්සන් කිරීමට අවශ්‍ය නැත. |
| 6. සාමස්තය | : ඉතා පැහැදිලි, සිත්කලු අකුරින් ලිවිය යුතු අතර යම් වැරදීමක් වුවහොත් එක ඉරකින් කපා නිවැරදි කළ යුතු ය. ලිපිය යැවීමට පෙර නැවත කියවා බැලීම වඩාත් සුදුසු ය. වචන අතර මෙන් ම පද පේළි අතර ප්‍රමාණවත් ඉඩක් තබමින් ලිපිය ලබන්නාගේ සිත ප්‍රබෝධවත් වන ආකාරයේ ආකර්ෂණීය අන්තර්ගතයකින් මෙන් ම නිමාවකින් ද ලිපියක් සමන්විත වීම වඩා උචිත ය. |

පෞද්ගලික ලිපි ලිවීමේ දී වුවත් සම වයසේ යහළුවකුට ලියන ලිපියකට වඩා දෙමාපියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරයකුට, පූජ්‍ය පක්ෂයට ආදි වශයෙන් ලියන කෙනා අනුව අන්තර්ගතයෙහි, ආමන්ත්‍රණයෙහි පවා යම් වෙනස්කම් ඇති වේ. විශේෂයෙන් ම බෞද්ධ හිමි නමකට පෞද්ගලික ලිපියක් ලිවීමේ දී ගරු බුහුමන් සහිත ව සැලකිල්ලෙන් ලිපිය ලිවිය යුතු යි. ඒ සඳහා භාවිත වන වෙනස් සම්ප්‍රදායක් හා වචන ඇත.

වාර්තා

පුවත්පත් වාර්තා, ගුවන් විදුලි හා රූපවාහිනී වාර්තා, ආදි වශයෙන් දේශපාලන, ආර්ථික, සමාජීය වැනි විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව වාර්තා සකසනු ලබයි. වාර්තාවක් පිළිබඳ මූලික අවබෝධයක් ලබා දෙන සරල පුවත්පත් වාර්තාවක් වෙත පමණක් මෙහි දී අවධානය යොමු කෙරේ.

මේ වාර්තාව දෛනික පුවත්පතක පළ කිරීමට සකස් වූවකි.

# යාල අභය භූමියට සංචාරක පක්ෂීන් රැසක්



මේ දිනවල යාල අභය භූමියට සංචාරක පක්ෂීන් රැසක් පැමිණ සිටින බව වනජීවී නිලධාරීහු පවසති. අභය භූමියේ තිබෙන ජලාශ හා පොකුණු ආශ්‍රිත ව මෙම පක්ෂීන් දැක ගැනීමට හැකියාව ඇත. ඒ සඳහා පැමිණෙන දේශීය, විදේශීය සංචාරකයන්ට අවශ්‍ය පහසුකම් සලසා ඇති බව වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නිවේදනයක් නිකුත් කරමින් දන්වා සිටියි.

# වාර්තාවක විශේෂ ලක්ෂණ

1. **ශීර්ෂ පාඨය** : වැදගත් කරුණු සියල්ල සංක්ෂිප්ත ව හා පාඨක ආකර්ෂණය යොමු වන පරිදි ලියවුණ ශීර්ෂ පාඨයක් වීම අවශ්‍ය ය.

2. **තොරතුරු** : වාර්තාකරුගේ නම, වාර්තා කරන දිනය, වාර්තා කරන ස්ථානය ශීර්ෂ පාඨයට යටින් යෙදීම (ප්‍රවෘත්ති වාර්තාවක දී පුවත්පතේ ඉහළින් සෑම පිටුවක ම දිනය සඳහන් වන බැවින් මෙලෙස දිනය නොයෙදේ.)


3. **අන්තර්ගතය** : සියලු කරුණු සංක්ෂිප්ත ව ඇතුළත් විය යුතු ය. මෙහි දී ශීර්ෂ පාඨයෙන් කියවුණ කරුණු අවශ්‍ය පමණට විස්තර කර පැහැදිලි ව දැක්විය යුතු ය.

4. **පණිවිඩය** : පුවත්පත් වාර්තාවකින් පාඨක සමාජයට සත්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතු ය. එසේ ම සමාජ සහජීවනය අවුල් වියවුල් නොවන පුද්ගල යහපැවැත්මට ය. රුකුලක් වන සදාචාර සම්පන්න භාවය නොයික්මවූ පණිවුඩ, වාර්තාවක ඇතුළත් වීම අවශ්‍ය ය.

ලිපි ගනුදෙනු මඟින් සපුරා ගත් බොහෝ අවශ්‍යතා වර්තමානය වන විට විද්‍යුත් මාධ්‍ය, දුරකථන ආදිය මඟින් ඉටු කර ගන්නා බව පෙනී ගියත් රාජ්‍ය අංශය, නීති අංශය වැනි බොහෝ ක්ෂේත්‍රවල තවමත් ලිපි ලේඛනවලට හිමි වන්නේ ප්‍රමුඛත්වයකි. ඒ වෛරස් වැනි විවිධ තාක්ෂණික ගැටලු නිසා පරිගණකගත තොරතුරු විනාශ වීමේ අවදානම, අධික වියදම, ව්‍යාප්තියේ අසමානකම, විශ්වසනීයත්වය වැනි හේතු සාධක මත ය. එබැවින් තවදුරටත් ප්‍රායෝගික වී ඇත්තේ ලිපි ලේඛන මඟින් ගනුදෙනු සිදු කිරීම යි. මෙවැනි පසුබිමක් තුළ අප ලිපි ලිවීමේ ක්‍රමවේද දැන සිටීම අවශ්‍ය බව පෙනේ.

# කුසලතා වර්ධනයට:

1. පාඩමෙහි දක්වා ඇති පෞද්ගලික ලිපියෙහි 'කුමාර' ඔබ යැයි සිතා පිළිතුරු ලිපියක් සකස් කරන්න.
2. පහත ලිපි ලියන්න.
   i පළෙහ් ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වීම ගැන සුබපතමින් බාල සොහොයුරාට
   ii වැඩි වූ නේවාසිකාගාර මාසික මුදල් ඉක්මනින් එවන ලෙස ඉල්ලමින් අම්මාට
   iii පිළිකා රෝහලේ ගිලනුන්ට උවටැන් කිරීමට යන ගමනකට එකතු වන ලෙස ආරාධනා කරමින් මිතුරකුට
3. පහත සඳහන් පුද්ගලයන්ට යැවෙන ලිපිවලට ගැළපෙන ආමන්ත්‍රණ පාඨය බැගින් ලියන්න.
   i සීයාට ii ගුරුවරයකුට
   iii භික්ෂූන් වහන්සේ නමකට iv ඥාති සොහොයුරකුට
4. පහත සඳහන් වාක්‍යවල ඇති ආශීර්වාදාත්මක සහ ආමන්ත්‍රණ පද හා ඒවාට ගැළපෙන පුද්ගලයන් තෝරා යා කරන්න.




2. පහත වාර්තා ලියන්න.
   i ඔබේ පිරිවෙනේ පැවති ඩෙංගු මර්දන වැඩසටහනක් පිළිබඳ වාර්තාවක්
   ii 2600 වැනි සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම වස් ගමේ පන්සලේ මූලිකත්වයෙන් සිදු කළ ලේ දන්දීමක් පිළිබඳ වාර්තාවක්
   iii පිරිවෙනේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවයක් පිළිබඳ වාර්තාවක්
3. ඔබ සිත් ගත් පුවත්පත් වාර්තා ශීර්ෂ පාඨ පහක් ලියා දක්වන්න.
4. ඔබ ඔබේ ප්‍රදේශයේ ප්‍රදේශීය පුවත්පත් වාර්තාකරුවකු යැයි සිතන්න. ප්‍රදේශය තුළ මෑතක දී සිදු වූ වැදගත් සිදුවීම් දෙකක් පිළිබඳ පුවත්පත් වාර්තා දෙකක් සකසන්න.

9

# අර්ථාවබෝධය

මුල් ම පාඩමේ දී උගත් පරිදි සිංහල භාෂාවේ ව්‍යවහාර දෙකක් හෙවත් 'ද්වීරූපතාවක්' තිබෙන බව අපි දනිමු. ඒ කථන ව්‍යවහාරය හා ලිඛිත ව්‍යවහාරය වශයෙනි. 'බස්පෑදිය' නමැති රූපසටහන ඔස්සේ ද මේ පිළිබඳ ව සවිස්තර ව කතා කර ඇත. පහත නිදසුන නැවත සිහිපත් කර බලන්න.

'මං ඉස්කෝලේ යනවා.' - *කථන ව්‍යවහාරය*

'මම පාසල් යමි.' - *ලිඛිත ව්‍යවහාරය*

ඉහත කථන හා ලිඛිත ව්‍යවහාර දෙක පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීම මෙහි දී අර්ථාවබෝධය යන්නෙන් අදහස් කරයි. එනම් මේ ව්‍යවහාර දෙකේ දී ම භාවිත කරන වචන, යෙදුම්, වාක්‍ය ආදියෙහි අරුත්, අදහස්, තේරුම් මැනවින් වටහා ගැනීම යි. මෙහි දී ලිඛිත ව්‍යවහාරය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ. එහි දී පහත දැක්වෙන පොදු උපදෙස් කිහිපය ඔබට යම් රුකුලක් සපයනු ඇති.

1 යම් වැකියක, පාඨයක වචන කෙරෙහි සැලකිලිමත් ව අවධානයෙන් යුතු ව කිහිප වරක් කියවීම.
2 එහි දී ඔබට ආගන්තුක අලුත් වචන හා අදහස පැහැදිලි නැති අරුත් මතක නැති වචන, යෙදුම් සටහන් කර ගැනීම.
3 ඒවා පිළිබඳ ව ගුරුවරයකුගෙන් අසා දැනගැනීම හෝ වෙනත් පොත්පත්, අන්තර්ජාල, පුවත්පත් ආදිය මගින් සොයා දැනගැනීම.
4 නිශ්චිත ව ම දැනගැනීම සඳහා ශබ්දකෝෂයක් (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය වැනි) පරිශීලනය කිරීම.
5 අදහස් සොයා ගැනීමෙන් පසු වැකිය හෝ පාඨය නැවතත් කියවා අර්ථය තහවුරු කර ගැනීම.
6 එවැනි වැකි, පාඨ, වචන යෙදුණු වෙනත් අවස්ථා කිහිපයක් හෝ විමසා බැලීම, සිහිපත් කර ගැනීම

පහත දැක්වෙන්නේ මහාචාර්ය තිස්ස කාරියවසම්, ප්‍රණීත් අභයසුන්දර යන විද්වතුන් විසින් සංස්කරණය කර ඇති 'මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද සමරු කලාපයේ සඳහන් ලිපියකින් උපුටා ගත් ඡේදයකි.

. . .

සමාජය ක්‍රමයෙන් විකාශනය විය යුතු අතර විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය හේතුවෙන් එය මුහුකුරා යන තත්ත්වයට පත් වේ. මේ සඳහා විවිධ පුද්ගලයෝ කරළියට පැමිණෙති. කලාව සම්බන්ධ ව, විද්‍යාවන් සම්බන්ධ ව, දේශපාලනය සම්බන්ධ ව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනෙන්නට හැකි ය. ඒ අතර ම කලාවන් සමඟින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය තුළින් ඉතිහාසයේ ස්ථානයන් දිනා ඇති පුද්ගලයන් ද එමට ය. එවැනි අය වීරයන් ලෙස ද, හඳුන්වන්නට හැකි ය. ධර්මවීර, යුද්ධවීර, දානවීර ලෙසට වීරයෝ තෙවැදෑරුම් වෙති.

. . .

අර්ථාවබෝධය සඳහා මුලින් දී ඇති උපදෙස් කෙරෙහි දැන් අවධානය යොමු කරන්න. ඒ අනුව ඉහත ඡේදය හොඳින් කියවන්න. එහි කෙනකුට තේරුම් ගැනීමට අපහසු යැයි සිතිය හැකි වචන තෝරන්න. පහත පරිදි සටහන් කර ගැනීම මුලින් ම කළ හැකි ය.

. . .

සමාජය ක්‍රමයෙන් විකාශනය විය යුතු අතර විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය හේතුවෙන් එය මුහුකුරා යන තත්ත්වයට පත් වේ. මේ සඳහා විවිධ පුද්ගලයෝ කරළියට පැමිණෙති. කලාව සම්බන්ධ ව, විද්‍යාවන් සම්බන්ධ ව, දේශපාලනය සම්බන්ධ ව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනෙන්නට හැකි ය. ඒ අතර ම කලාවන් සමඟින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය තුළින් ඉතිහාසයේ ස්ථානයන් දිනා ඇති පුද්ගලයන් ද එමට ය. එවැනි අය වීරයන් ලෙස ද, හඳුන්වන්නට හැකි ය. ධර්මවීර, යුද්ධවීර, දානවීර ලෙසට වීරයෝ තෙවැදෑරුම් වෙති.

. . .

ඒ අනුව ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයේ එම වචන සඳහා දී ඇති තේරුම් අතරින් මේ වචන යෙදී ඇති පරිසරය අනුව අර්ථයෙන් වඩාත් ම ගැළපෙන වචනය තෝරා ගෙන ඇත.

| | | |
|---|---|---|
| විකාශනය | = | ඉදිරියට ගෙන ඒම |
| මුහුකුරා | = | මෝරා |
| කරළියට | = | වේදිකාව (මෙහි දී 'සමාජයේ ඉදිරියට ඒම' ලෙස අදහස ගත යුතු යි.) |
| පෙරටු | = | පළමු වැන්න |
| ස්ථානයක් | = | තැනක් |
| එමට | = | බහුල |
| තෙවැදෑරුම් | = | තුන් ආකාර |

මෙලෙස ඡේදයේ තේරුම් ගැනීමට අපහසු වචනවල අරුත් පැහැදිලි කර ගන්නා අතර ම වාක්‍යවල තේරුම ද මැනවින් වටහා ගත යුතු ය. පූර්ණ අර්ථාවබෝධයක් ලැබෙන්නේ එවිට ය. ඒ අනුව පහත ප්‍රශ්නවලට ඡේදය ආශ්‍රයෙන් පිළිතුරු සෙවීමෙන් ද අර්ථාවබෝධය ලබා ගැනීම පහසු වන අතර අර්ථාවබෝධය නිසි ලෙස සිදු වී ඇති දැයි දැනගැනීමටත් හැකියාව ලැබේ.

1. සමාජය මුහුකුරා යන තත්ත්වයට පත් වන්නේ කුමක් නිසා ද?
   විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය නිසා
2. මෙම ඡේදයට අනුව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනිය හැකි විෂය ක්ෂේත්‍ර මොනවා ද?
   කලාව, විද්‍යාව සහ දේශපාලනය
3. යම් යම් පුද්ගලයන් ඉතිහාසයේ යම් ස්ථානයක් දිනා ඇත්තේ කුමන හේතුවක් නිසා ද?
   කලාවන් සමගින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය හේතුවෙන්.
4. වීරයන් ලෙස හඳුන්වන්නේ කවුරු ද?
   කලාවන් සමගින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය නිසා ඉතිහාසයේ යම් ස්ථානයක් දිනා ඇති පුද්ගලයන් වීරයන් ලෙසින් ද හැඳින්වේ.
5. තෙවැදෑරුම් වීරයෝ කවරහු ද?
   ධර්මවීර, යුද්ධවීර හා දානවීර නමින් හැඳින්වෙන වීරයන් තුන් පිරිස.

මේ අනුසාරයෙන් ගද්‍ය පමණක් නොව පද්‍ය ඛණ්ඩවල ද අර්ථාවබෝධය ලබා ගත හැකි ය. මෙම පෙළ පොතේ කුසලතා වර්ධනය සඳහා ලබා දී ඇති අභ්‍යාස බොහෝමයක් ම සකසා ඇත්තේ ඔබේ අර්ථාවබෝධ හැකියාව වර්ධනය වන පරිදි ය. මෙවැනි පාඩමක් විශේෂයෙන් ඇතුළත් කර ඇත්තේ මූලික කරුණු කිහිපයක් අවධාරණය කරනු පිණිස යි.

# කුසලතා වර්ධනයට:

1. පහත සඳහන් කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### හෙළ රණ දෙරණ

හෙළ පුතේ මේ රට ඔබේ
ඔබට විය උරුම ව තිබේ
මෙවැනි පොළොවක් මුළු ලොවේ
නොමැත මෙහි හැම දේ වැවේ
මෙහි රට ඔබ සරු කරන්නට
පුතේ අද සිට හිතට ගන්නට
ඔබෙන් විය යුතු යුතුකම එසේ
ඉටු කරනු කුසගිනි නැසේ
රටින් රට හිඟමනේ යන්නට
නිගරුවකි විය සිංහලුන් හට
ඔබට රිසි දේ වගා කරමින්
එයින් කුසගිනි නිවා ගනිමින්
රටක් රැකගෙන හෙළ පුතේ
දැයක් රැකගෙන හෙළ පුතේ
විජිතපුර බලකොටු එදා
කඩා දැය කරගෙන මුදා
ඔබට නිදහස රැක දෙමින්
හෙළ විරුන් ඔබු පෙන්වමින්
අපේ එඩිතර විරයන්හට
පුතේ හොඳ හැනෙ නිගා දෙන්නට
ඔබත් එම මග ගෙනෑ පුතේ
සරු කරනු රට හෙළ පුතේ
රටේ ආලෝකය ඔබයි
ඔබේ ආලෝකය රටයි
හෙළ පොළොව ලොව සරු බිමයි
පුතේ ! ඔබ ඉපදුණ බිමයි

- වත්තඹුවේ සිලදාස

i (අ) මේ රට උරුම ව තිබෙන්නේ කාහට ද?
(ආ) සිංහලුන්හට නිගරුවක් වන්නේ කුමක් ද?
(ඇ) කුසගිනි නිවාගත යුත්තේ කුමක් කිරීමෙන් ද?
(ඈ) එදා දැය මුදා ගත්තේ කෙසේ ද?
(ඉ) නිගා දෙන්නට හොඳ නැත්තේ කාහට ද?
(ඊ) ලොව සරු බිම කුමක් ද?

ii (අ) මෙම ගීතයේ සඳහන් පහත යෙදුම් සඳහා සුදුසු සමාන පද ලියන්න.

- උරුම
- නිගරුව
- රිසි
- හිගමනේ
- සරු
- ආලෝකය
- එඩිතර
- හෙළ
- දැය

2. පහත දැක්වෙන කවිය කියවන්න. එහි අදහස ලියන්න. කවිය කටපාඩම් කර ගන්න.

